# උහන ප්‍රාදේශීය සභාවේ පැවති 07 වන සභා වාරයේ පනස් නවවන සභා රැස්වීම් වාර්තාව

දිනය ඃ- 2023.02.09 පෙ.ව. 10.00

| | | |
|---|---|---|
| 1. | ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මයා | ගරු සභාපති |
| 2. | එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා | ගරු උප සභාපති |
| 3. | රංජිත් වනිගසිංහ ඒකනායක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 4. | ඒ සුසන්ත කුමාර කුසුම්සිරි මය | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 5. | ඩී. ආරියරත්න දෙලංකාවල මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 6. | ඊ.ආර්. සුමනාවති මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 7. | පූජ්‍ය උඩවෙල ධම්මතිලක හිමි | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 8. | එල්.එච්. කරුණාසේන දයාතිලක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 9. | පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 10. | එම්.එම්. මාලක මිහිර බණ්ඩාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 11. | කේ.එම්. කුලතුංග මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 12. | එන්.එච්. ලාල් ජයන්තසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 13. | එල්.ආර්. චන්ද්‍රසේකර බණ්ඩාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 14. | එච්.පී. ජයතිලක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 15. | ආර්.ඒ.ඩී. සිසිර ශාන්ත කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 16. | ඒ.ලලිත් කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 17. | කේ. ප්‍රේමසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 18. | කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 19. | එන්. අමරකීර්ති මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 20. | ඒ. නන්දිකා ප්‍රියන්ති කුමාරි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 21. | ජේ.පී. සුගන්ධි ෂාවිකා මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 22. | ජේ.ආර්. ජගත් ප්‍රසන්න මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 23. | කේ.බී. විමලරත්න මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 24. | ආර්.එම්. ජයවීර රත්නායක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 25. | එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 26. | ඩබ්.ඩී. දර්ශන නුවන් විශ්නදේව මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 27. | ඩී.එම්. සීතා කුමාරිහාමි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |

නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්

| | | |
|---|---|---|
| 1. | එන්.ජී. චතුරංග දර්ශන කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 2. | පී.කේ. තරිඳු තුෂාන් ධනංජය මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 3. | කේ.වී.ජී. නයනා කුමුදුනි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 4. | ඩබ්. රාණි මැණිකේ මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |

01.ආගම සිහිකිරීම හා මියගිය රණ විරුවන් සිහිකිරීම

ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි සියළුම මන්ත්‍රීවරු පිළිගැනීමෙන්ද ආගමික වතාවත් සිදු කිරීමෙන් අනතුරුව රට වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් සිහි කිරීමෙන් පසු පෙ.ව.10.00 රැස්වීම් කටයුතු ආරම්භ කරන ලදී.

රැස්වීම ආරම්භයේදී ගරු මන්ත්‍රීවරුන් 21 දෙනෙක් පැමිණ සිටින ලදී.

| | | |
|---|---|---|
| 1. | ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මයා | ගරු සභාපති |
| 2. | රංජිත් වනිගසිංහ ඒකනායක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 3. | ඒ සුසන්ත කුමාර කුසුම්සිරි මය | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 4. | ඩී. ආරියරත්න දෙලංකාවල මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 5. | ඊ.ආර්. සුමනාවති මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 6. | පූජ්‍ය උඩවෙල ධම්මතිලක හිමි | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 7. | එල්.එච්. කරුණාසේන දයාතිලක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 8. | පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 9. | එම්.එම්. මාලක මිහිර බණ්ඩාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 10. | කේ.එම්. කුලතුංග මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 11. | එන්.එච්. ලාල් ජයන්තසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 12. | එල්.ආර්. චන්ද්‍රසේකර බණ්ඩාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 13. | ආර්.ඒ.ඩී. සිසිර ශාන්ත කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 14. | ඒ.ලලිත් කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 15. | කේ. ප්‍රේමසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 16. | කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 17. | ඒ. නන්දිකා ප්‍රියන්ති කුමාරි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 18. | ජේ.පී. සුගන්ධි ෂාවිකා මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 19. | කේ.බී. විමලරත්න මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 20. | ආර්.එම්. ජයවීර රත්නායක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 21. | ඩී.එම්. සීතා කුමාරිහාමි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |

**02.පසු ගිය මස සභා වාර්තාව ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපතිතුමා**

මා විසින් න්‍යාය පත්‍රය සමග ලැබෙන්නට සැලැස්වූ පසුගිය මස සභා වාර්තාව කියවන ලද සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් නොමැති නම් වාර්තාගත කර ඇති පරිදි ස්ථිර කර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී පී.ඒ.අයි.සන්ධ්‍යා පලිහක්කාර මිය විසින් සභා වාර්තාව ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත සභා වාර්තාව සම්මත විය.**

**03.ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන - නැත**

**04.සන්දේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන - නැත**

**05. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.05 ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.පී.ප්‍රියන්ත සිසිර කුමාර මයා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.10 ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්.අමරකීර්ති මයා හා ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.පී.ජයතිලක මයා පැමිණෙන ලදි.

**06. යථා පරිදි කල් දී ඇති යෝජනා සභාවට ඉදිරිපත් කිරීම**

**යෝජනා අංක 06/2023/02(01)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින්, උහන ප්‍රාදේශිය සභාවේ ගෙවීම් කටයුතු සඳහා පළමු අත්සන ලෙස ලේකම් තනතුරේ රාජකාරි භාරගන්නා ලද එම්.ඒ.පී.මැදගොඩ මහත්මියගේ අත්සන යොදාගැනීමට සභාවේ අනුමැතිය සඳහා යෝජනා කොට ඉදිරිපත් කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා විසින් ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2023/02(02)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින්, උහන ප්‍රාදේශිය සභාවේ ප්‍රසම්පාදන , පරිසර , නිවාස හා ප්‍රජාසංවර්ධන පුස්තකාල , කසල කළමනාකරණ හා කළමනාකරණ මෙහෙයුම් යන කමිටු වල සාමාජික ලෙස කටයුතු කල පී.ඒ.අයි.අයි. මැණිකේ මෙනවිය ස්ථාන මාරු වූ බැවින් ඒ සඳහා ලේකම් තනතුරේ රාජකාරි භාර ගන්නා ලද එම්.ඒ.පී මැදගොඩ මහත්මිය 2023.01.16 දින සිට පත් කිරීමට සභා අනුමැතියට යෝජනා කොට ඉදිරිපත් කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.පී. ජයතිලක මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2023/02(03)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින්,ලේකම් තුමියගේ නිවාඩු දින වැටුප් ගෙවීම හා දුරකතන දීමනා රු. 1500.00 ලබා ගැනීම සඳහා සභා අනුමැතියට යෝජනා කොට ඉදිරිපත් කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ. ප්‍රේමසිරි මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.**

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා**

ලේකම් තුමියගේ නිවාඩු දින වැටුප් ගෙවීම හා දුරකතන දීමනා ගෙවීම සඳහා අනුමැතිය සඳහා පලාත් පාලන සහකාර කොමසාරිස් මගින් පලාත් පාලන කොමසාරිස්ට ලිඛිතව ලිපි යොමු කලවිට එම දීමනා මෙතුමියට හිමි නම් ඒ සඳහා අනුමැතිය ලබා දීම සිදු වේවි යැයි ප්‍රකාශ කරන ලදි.එතුමියට එම දීමනා චක්‍රලේක මගින් හිමි නම් ඒවා ගෙවීම් සිදුකලාට කිසිම විරුද්ධත්වයක් නැති බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ. විමලරත්න මයා.**

ලේකම්තුමිය රාජ්‍ය නිළධාරිණියක් බවත්,එතුමියට එම දීමනාව හිමි නම් ඒවා ගෙවිය යුතු බව ප්‍රකාශ කරන ලදි . රාජ්‍ය නිළධාරිණියක් වශයෙන් සේවය කරන එතුමියට චක්‍රලේඛ හෝ අනපනත් අනුව එතුමියට එම දීමනාව හිමිනම් ගෙවිය යුතු බව ප්‍රකාශ කරන ලදි.මා දකින ආකාරයට සභාවෙන් ඒ සඳහා සම්මත කිරීමක් අවශ්‍යය නොවන බව ප්‍රකාශ කරන ලදි.නමුත් නීති අනපනත් අනුව එතුමියට ඒවා හිමි නොමැතිනම් සභාවේ සම්මත කර එම දීමනා ගෙවීමටද හැකියාවක් ඇති බව ප්‍රකාශ කරන ලදි.එම නිසා ඒ ක්‍රම දෙක පටලවා ගන්නේ නැතිව ප්‍රථමයෙන්ම අප බැලිය යුත්තේ එතුමියට එම දීමනා නීත්‍යානුකූලව හිමිද යන්නයි.එසේ හිමි නම් අපෙන් අනුමැතිය අවශ්‍යය නොවන බවත් , එසේ හිමි නොමැතිනම් සභාවේ යෝජනාවක් ගෙන එතුමියට එම දීමනා ගෙවීම සාධාරණ බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා**

මෙම දුරකතන දීමනා හා නිවාඩු දින වැටුප් එතුමියට හිමි නොමැතිනම් සභා අනුමැතියක් අරගෙන ගෙවිය හැකි වුවත් මා ඒ සඳහා විරුද්ධ බව ප්‍රකාශ කරන ලදි.මීට පෙර සිටි ලේකම් තුමියටත් එසේ ගෙවීම් නොකල බැවින් මෙතුමියටද සභා අනුමැතිය අරගෙන ගෙවීම් කිරීම සිදු නොකල යුතු බව ප්‍රකාශ කරන ලදි.නමුත් මෙතුමියට නීත්‍යානුකූලව එම දීමනා හිමිනම් අනිවාර්යයෙන් ගෙවීම් කලයුතු බව ප්‍රකාශ කරන ලදි.

**ගරුසභාපති තුමා.**

සභාව විසින් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දුන්නත් , සභා අනුමැතිය සමග චක්‍රලේඛ අමුණා පලාත් පාලන සහකාර කොමසාරිස් මගින් පලාත් පාලන කොමසාරිස්ට අනිවාර්යයෙන් ලිපි යොමුකර අනුමැතිය ලබා ගත යුතු බවත් පැහැදිලි කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මයා**

විමලරත්න මන්ත්‍රීතුමා පැවසූ පරිදි මේ සඳහා හිමිකමක් තිබෙනවානම් සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට අවශ්‍යය නොවන බවත්, සභා අනුමැතියක් අරගෙන එය යැවූ පසු එහි වගකීම අප විසින් ගතයුතු බැවින් ඔබතුමා මේ පිලිබඳ විමසීමක් සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.චක්‍රලේඛ තිබෙනවානම් විමසීමක් සිදු කිරීමට අවශ්‍යය නොවන බවත් , එසේ චක්‍රලේඛ නොමැතිනම් පලාත් පාලන කොමසාරිස් ගෙන් විමසීමක් සිදු කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදි.ලංකාවේ අනිත් ප්‍රාදේශිය සභා ,නගර සභා,මහ නගර සභා, සියල්ලේම වාගේ මන්ත්‍රීවරුන්ට දුරකතන දීමනා, ගමන් වියදම්, ඉන්ධන වියදම් , සියළුම දේ හිමි බවත්, එතුමන්ලාට සභාවෙන් සම්මත කර ලබා දී තිබෙන බවත් , අම්පාරේ පමණක් ඒවා නොමැති බවත් , සභාවට පැමිණි මුල් කාලයේ අනුමැතිය ලබා ගැනීමට කතා කලත් , ඒ පිළිබඳ කටයුතු නොකල බවත් , ඒ සඳහා මේ සභාවෙන් ලිපියක්වත් යොමු නොකල බවත් ප්‍රකාශ කරන ලදි. එසේ තිබියදී අප විසින් සභා සම්මත කර ලේකම්තුමියට එම දීමනා ලබා දීමට අවශ්‍යයතාවයක් නොමැති බවත් , එතුමියට හිමි කමක් තිබෙනවානම් එය ලබා දිය යුතු බව ප්‍රකාශ කරන ලදි. මන්ත්‍රීවරුන්ට තිබෙන හිමිකම ලබා නොදී ලේකම්තුමියට අප විසින් එම දීමනා අමුතුවෙන් ලබා දීම අවශ්‍යය නොවන බව පැහැදිලි කරන ලදි.මෙය ඔබතුමියට දක්වන

විරෝධතාවයක් නොවන බව ප්‍රකාශ කරන ලදි. මා සිතන ආකාරයට ඔබතුමියට එම දීමනා සඳහා හිමිකමක් ඇති බැවින් එම දීමනා ගෙවීමට ඉහල නිළධාරීන්ගෙන් අදහස් විමසා කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරුසභාපති තුමා.**

මේ කාරණය දිගින් දිගටම කතා කිරීමට අවශ්‍යය නොවන බවත් , පලාත් පාලන කොමසාරිස්ට යොමුකර මේ සඳහා අනුමැතිය ලබා ගත හැකි බවත් , සමහර අවස්ථාවල චක්‍රලේඛ නීතිරීති , තිබුනට සභාවේ මූල්‍යමය තත්වය සලකා බැලිය යුතු බවත් , සභාවට එම මුදල් ගෙවීමට හැකියාව තිබෙනවාද යන්න විමසා බැලිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.එම හේතුව නිසා සභාවේ අනුමැතිය අරගෙන ඉහල නිළධාරීන්ගේ අනුමැතිය සඳහා යොමු කිරීම සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.පසුගිය මාස වල සභා වාර්තා වල පුහුණු දීමනා ගෙවුවේ කෙසේදැයි විමසන බවත් , එමනිසා සභාවට ඉදිරිපත් කර අනුමැතිය ගත්විට එසේ ප්‍රශ්න කරන්නට නොහැකි නිසා සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කල බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

මෙම දීමනාවට එතුමියට හිමිකමක් ඇත්නම් ඒ සඳහා චක්‍රලේඛ ඇති බවත් , ඒ චක්‍රලේඛ අංක අනුව යැයි සඳහන් කර මෙම යෝජනාව ඉදිරිපත් කලානම් මෙපමණ කතා කල යුතු නැති බවත් , ඒ අඩුපාඩුව සමග යෝජනාව ඉදිරිපත් කිරීම නිසා ගැටළු සහගත බවත් පෙන්වා දෙන ලදි .ඔබතුමා සභාවේ මූල්‍ය තත්වය ගැන සලකා යැයි පැවසූ නිසා මම මෙසේ පැවසූ බවත් , සභාවේ මූල්‍ය තත්වය දුර්වල නිසා එසේ ගෙවීමට නොහැකි බවද පෙන්වා දෙන ලදි.නමුත් සභාවේ මූල්‍යතත්වය කොතරම් දූර්වල වුවත් මෙතුමියට රාජකාරීමය වශයෙන් මෙය හිමි නම් එය ගෙවිය යුතු බව ප්‍රකාශ කරන ලදි.පුහුණු දීමනා ගෙවීම සම්බන්ධව මම ඉතාම විරුද්ධ බවත් , පසුගිය සභා වාරයක අතිකාල දීමනා අනුමත කර ගැනීමට යෝජනාවක් ඉදිරිපත් කල බවත් , එහිදී අවසන් ගිනුම සකස් කරන නිළධාරීන්ට පෙබරවාරි මස දක්වා අතිකාල දීමනා ගෙවීමට අනුමැතිය ඉල්ලා තිබූ බවත් , අපි එයට විරුද්ධ වූ බවත් මුදල් ලබා දී පුහුණු වීම් කල පසුත් තමන්ගේ රාජකාරිය හරියට කරන්නට බැරිව අතිකාල දීමනා ඉල්ලන බවත් ප්‍රකාශ කරන ලදි.එම නිසා මෙතුමියටත් මේ දීමනාව හිමි නම් ගෙවීම් සිදුකලයුතු බවත් ,හිමි නැතිනම් ගෙවීම් සිදු නොකල යුතු බවත් පෙන්වා දෙන ලදි.මූල්‍ය තත්වය යහපත් අතට ගෙන ඒමට කටයුතු කර ඉන් පසු ඒ ගැන සලකා බැලීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මයා**

පුහුණු දීමනා ගෙවීමසම්බන්ධව මමත් දැඩි ලෙස විරුද්ධ වූ පුද්ගලයෙක් ලෙස මේ පිළිබඳ කතා කල යුතු බවත් , නිළධාරීන් පුහුණු වෙන එකට ගෙවන මුදල සම්බන්ධව අපි විරුද්ධ නොවුනු බවත් , එයට විරුද්ධ වීමට පැහැදිලි හේතු තිබුනු බවත් ප්‍රකාශ කරන ලදි.සභාවාර්තාව සකස් කිරීමේදී , දැන් සිටින නිළධාරිණිය පැමිනෙන්නට පෙර , සභාවාර්තාව සකස් කරන අය සිටියදී වෙනත් අය පුහුණුවීම් වලට යැවූ බවත් , සභා වාර්තාවේ යම් දෙයක් පැවසූ විට මම ටයිප් කරන්නට දන්නේ නෑ කියූ අය සිටි බවත් , වාහන අළුත්වැඩියා කිරීමේ පුහුණු වැඩමුළු වලට කාන්තාවන් යැවූ බව ප්‍රකාශ කරන ලදි.එවැනි පැහැදිලි හේතු තිබුන නිසා අපි පුහුණු දීමනා ගෙවීම සම්බන්ධව විරුද්ධ වූ බවත් , නොමැතිනම් , ඉරිසියාවට , කුහකකමට විරුද්ධ නොවූ බවත් ප්‍රකාශ කරන ලදි. සභාවාර්තාව සකස්කරන නිළධාරීන් සිටියදී වෙන නිළධාරීන් එම පුහුණු වැඩමුළුවලට යැවූ බව හොඳටම මතක බවත් ,ඔවුන්ට සභාවාර්තාව සකස් කරන්නට කියූ විට ටයිප් කරන්නට දන්නේ නෑ යැයි පැවසූ බවත් ප්‍රකාශ කරන ලදි.එම නිසා ඉදිරියේදී එවැනි වැඩමුළු පැමිණි විට වැඩකරන මෙම නිළධාරී තුමිය යවනවා මිස වෙන අය ඒ පුහුණුවට යැවීම සිදු නොවිය යුතු බව ප්‍රකාශ කරන ලදි.අදාල නැති අය පුහුණු වැඩමුළු වලට යැවීම නොකල යුතු බව ප්‍රකාශ කරන ලදි.එම පුහුණුවෙන් ඵලදායීතාවයක් තිබෙනවානම් ඒ සඳහා මුදලක් වියදම් වූවාට කිසිම ප්‍රශ්නයක් නැති බව ප්‍රකාශ කරන ලදි.

**ගරුසභාපති තුමා.**

දෙලංකාවල මන්ත්‍රීතුමා පැවසූ කාරණය ඉතා වැදගත් බවත් , අලුතින් පැමිණි ලේකම්තුමියට ඒ තුලින් අදහසක්ගතහැකි බවත් ප්‍රකාශ කරන ලදි.පුහුණු වැඩමුළු වලට නිළධාරීන් යැවීමේදී අප සමග සාකච්ඡා කොට නිළධාරීන් යොමු කිරීමට ඉදිරියේදී වගබලා ගතයුතු බව ප්‍රකාශ කරන ලදි.මා දැනුවත් කර අදාල නිළධාරීන් පමණක් ඒ සඳහා යොමු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.21 ගරු ප්‍රා.ස.මන්ත්‍රී දර්ශන නුවන් විශ්නදේව මයා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.25 ගරු ප්‍රා.ස.මන්ත්‍රී ජේ.ආර් ජගත් ප්‍රසන්න මයා පැමිණෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්.චමින්ද පුෂ්පකුමාර මයා.**

හිටපු සභාපතිතුමා හා දෙලංකාවල මන්ත්‍රීතුමා පැවසූ කරුණු මත නොයෙක් නොයෙක් ප්‍රශ්න ඇදාගෙන යන බවත් ප්‍රකාශ කරන ලදි.එතුමියට රාජ්‍ය නිළධාරියක ලෙස එම දීමනාව හිමිනම් එය ලබා දීම පිලිබද අපේ අකමැත්තක් නැති බවත් , ඒ සම්බන්ධව අපට කිසිම ප්‍රශ්නයක් නැති බවත් ප්‍රකාශ කරන ලදි.නමුත් ඔබ තුමාගේ ප්‍රකාශයකදී මූල්‍යමය තත්වය ගැන සලකා කටයුතු කලයුතු බව සඳහන් වූ නිසා හා සභා අනුමැතිය ඉල්ලා සිටි නිසා අපේ සභා අනුමැතිය ඒ සඳහා ලබා නොදෙන බවත් , එතුමියට එම දීමනාව හිමිනම් සභා අනුමැතියක් ඒ සඳහා අවශ්‍යය නොවන බවත් , නීතිමය තත්වය මත පලාත් පාලන සහකාර කොමසාරිස් මගින් පලාත් පාලන කොමසාරිස්ට යොමු කිරීමේදී සභා අනුමැතියක් අවශ්‍යම නම් එහිදී යම් මැදිහත් වීමක් සිදුකල හැකි බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය.**

අවුරුදු පහක් පුරාවට සභාවාර්තාවේ ප්‍රශ්න තිබුනු බවත් , පරිපාලන නිළධාරිණිය ලෙස සභාවේ අයිතිය , සභාවේ සේවකයින්ගේ , භාණ්ඩ වල සියළුම දේ වල අයිතිය ලේකම් තුමියට පැවරෙන බවත් , එම නිසා සභා වාර්තාව සකසා අවසන් වූ පසු එහි අඩුපාඩු සියල්ල කියවා බැලිය යුතු බව ප්‍රකාශ කරන ලදි.එම නිසා සභාපතිතුමා පැවසූ පරිදි ඔබතුමිය පරිපාලන නිළධාරිණිය ලෙස කටයුතු කිරීමේදී , ලිපි ලේඛන හා කලයුතු වැඩකටයුතු සභාපතිතුමා සමග සාකච්ඡා කර විසදාගෙන ඉදිරියට කටයුතු කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදි.ප්‍රශ්න පැන නොනගින ආකාරයට වැඩකටයුතු කරන්න යැයි ඔබතුමියගෙන් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මයා**

චක්‍රලේඛ අනපනත් වලට අනුව ලේකම්තුමියට මෙම දීමනාව හිමි නම් එය ගෙවීම සිදුකල යුතු බවත් , එසේ නොමැතිනම් මෙතුමියට එවැනි දෙයක් හිමිදැයි විමසා බලා කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.ඒ සඳහා සභා අනුමැතියක් අවශ්‍යය නොමැති බව ප්‍රකාශ කරන ලදි.

**එම දීමනා ගෙවීම සඳහා පලාත් පාලන සහකාර කොමසාරිස් මගින් පලාත් පාලන කොමසාරිස් වෙත ලිඛිතව යොමු කර අවශ්‍යය කටයුතු සිදු කිරීමට තීරණය විය.**

**එම තීරණය එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සම්මත විය.**

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.30 ගරුඋපසභාපති එච්.එම්.ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.33 ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.බී. විමලරත්න මයා පිටවී යන ලදි.

**යෝජනා අංක 06/2023/02(04)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින්,LDSP ව්‍යාපෘතිය මගින් අඩු ආදායම්ලාභී පවුල් 2500ක් සඳහා බීජ බෙදාදීම හා අලෙවි කටයුතු සිදුකිරීමට සහා අනුමැතිය සඳහා යෝජනා කොට ඉදිරිපත් කරන ලදි.

**ගරුසභාපති තුමා.**

ඉහත යෝජනාවට අනුව LDSP ව්‍යාපෘතිය මගින් මිලියන 18 ක මුදලක් උහන ප්‍රාදේශිය සභාවට ලැබෙන බවත් , අලෙවි කටයුතු සිදුකිරීමට පොළ භූමියේ පරණ කඩ කාමර 06 ක් කඩා ඉවත් කර නැවත අංගසම්පූර්ණව සෑදිම සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.**

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්. අමරකීර්ති මයා.**

මෙම ස්ථානය ටවුමේ තිබෙන වැදගත්ම , ප්‍රධාන තැන බවත්, අපේ කාර්මික නිළධාරීන් ලවා හෝ වෙනත් කෙනෙකු ලවා හෝ හොඳ සැලැස්මක් සකස්කර ඒ අනුව කටයුතු කලයුතු බවත් , තට්ටු දෙකකට හෝ තුනකට වෙන්න පුළුවන් බවත් හොද සැලැස්මක් තිබිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.අළුත් තාක්ෂණය තිබෙන බැවින් ඇසට දුටුවිට මනුස්සයකුට එතනට යන්නට හිතෙන සැලැස්මක් වැඩය පටන්ගන්නට ප්‍රථම අනුමත කර ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.ඉඩම පෙන්වා දක්ෂ සැලැස්මවල් අදින පුද්ගලයකු හමුවී උපදෙස් අරගෙන කටයුතු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි.වැසිකිලි පද්ධතිය පොදුවේ හදනවාද , හැම කඩ කාමරයකටම එක බැගින් හදනවාද යන්න සැලසුම් කලයුතු බව ප්‍රකාශ කරන ලදි.ඒ සඳහා උපදෙස් ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**එම අවස්ථාවේ පැමිණ රැදී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යෝජනාව ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2023/02(05)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින්,2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ සභාපති සඳහා පලාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ ප්‍රජා සංවර්ධන නිළධාරී ඩී.එම්.තිලකාවතී මහත්මිය වෙනුවට සංවර්ධන නිළධාරී ටී.බී.එස් .දර්ශණ මහතා පත් කිරීමට සහා අනුමැතියට යෝජනා කොට ඉදිරිපත් කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඒ.සුසන්ත කුමාර කුසුම්සිරි මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැදී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යෝජනාව ඒකමතිකව සම්මත විය.**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින්,වැරැන්කැටගොඩ කඩ කාමර ප්‍රසම්පාදන කටයුතු කිරීමේදී ඒ සඳහා අත රැඳවුම් මුදල් (Key Money) ලෙස පහල මහල සඳහා රු.200,000.00 ක මුදලක් හා ඉහල මහල සඳහා රු.100,000.00 ක මුදලක් තැන්පත් වශයෙන් ගොඩනැගිල්ලේ ආරක්ෂක තැම්පතුවක් ලෙස ලබා ගැනීමට සභාව මගින් තීරණය කලයුතු අතර මාස 03 කට අදාල කඩකුලී මුදලක් , කඩකුලී පැහැර හැරීමක් සිදුවුව හොත් අයකර ගැනීමේ තැන්පතු මුදලක් ලෙස ලබා ගැනීමටත් , අදාල කඩ කාමර සඳහා රක්ෂණාවරණයක් කලයුතු බවට අවශ්‍යාය සහා අනුමැතිය සඳහා යෝජනා කොට ඉදිරිපත් කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.පී.ජයතිලක මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.**

**ගරුසභාපති තුමා.**

මෙම යෝජනාව සම්බන්ධව පැහැදිලි කිරීම සඳහා ලේකම්තුමියට අවස්ථාවක් ලබා දීම සඳහා මහා සභාව කාරක සභාවක් කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.පී.ජයතිලක මහතාගේ සහ ගරු ප්‍රා.ස.මන්ත්‍රී ආර්.ඒ.ඩී.සිසිර ශාන්ත කුමාර මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභාව කාරකසභාවක් බවට පත්විය .

ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතාගේ සහ ගරු ප්‍රා.ස.මන්ත්‍රී ආර්.ඒ.ඩී.සිසිර ශාන්ත කුමාර මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහා සභාවක් බවට පත්විය .

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

ලේකම්තුමිය පෙර තිබූ තත්වය පැහැදිලි කල බවත් නව තත්වය ලෙස කඩ කාමර කුලී මාස තුනක තබා ගන්නා ලෙස පැහැදිලි කල බවත් , නමුත් සුරකුම් දෙකක් අපට තබා ගත නොහැකි බවත් , රු. 200,000.00 අප විසින් ලබා ගන්නා හෙයින් එයින් මේ වාරික අඩු කර ගැනීමේ හැකියාව තිබෙන බැවින් නැවත කඩ කුලී මාස 03 ක රඳවා තබා ගැනීම කල නොහැකි බව පෙන්වා දෙන ලදි.නමුත් එම යෝජනාවේ තිබෙන රක්ෂණාවරණය කිරීම ඉතා වැදගත් බව ප්‍රකාශ කරන ලදි. රක්ෂණාවරණයදමන විට කඩ කාමර යාබදවම තිබෙන බැවින් , එක් ස්ථානයක ගිනි ගැනීමක් සිදුවුව හොත් ගොඩනැගිල්ලම විනාශ විය හැකි බවත් , එවිට සමස්ත සියළු දෙනාටම දේපල අහිමි වන බැවින් අනිවාර්යයෙන්ම සියළුමදෙනා රක්ෂණය කර ගැනීම සිදුවිය යුතු බව ප්‍රකාශ කරන ලදි.නමුත් කඩ පහක් ගත්විට එම කඩ විවිධ ආකාරයේ වෙළදාම් කරන බැවින් විවිධ ආකාරයේ රක්ෂණ ක්‍රම සිදුවිය යුතු බැවින් , එම වෙලෙන්දන් විසින්ම ඔවුන්ට අදාල රක්ෂණ ක්‍රම කර ගත යුතු බව ප්‍රකාශ කරන ලදි.එම කඩය රක්ෂණය කල පසු කඩය භාර දීම සිදුවිය යුතු බව ප්‍රකාශ කරන ලදි. රක්ෂණය කණ්ඩණය නොවී කරගෙන යන වැඩපිළිවෙලක් සැකසීම සාර්ථක බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ජේ.ආර්.ජගත් ප්‍රසන්න මයා.**

සභාව විසින් සමස්ත ගොඩනැගිල්ලට රක්ෂණය දමා දීම සුදුසු බවත් ,එවිට මාසික ගාස්තුවට එම මුදලත් ඇතුලත් කිරීම සුදුසු බවත්, එවිට එය අතපසු වීමකින් තොරව ඉදිරියට යන බවත් පෙන්වා දෙන ලදි.තමන්ගේ භාණ්ඩ සඳහා තමන්ට රක්ෂණයක් වුවමනානම් දමා ගත්තාට ප්‍රශ්නයක් නොවන බවත් , ගොඩනැගිල්ල සඳහා අප විසින් රක්ෂණය දමා දීම සුසුසු බව ප්‍රකාශ කරන ලදි.

**ගරුසභාපති තුමා.**

මේ දිනවල ගිවිසුම් අත්සන් කල කාලය ඉවර කඩ කාමර 05 ක් ටෙන්ඩර් කර තිබෙන බවත් , ඉදිරියේදී ගිවිසුම් අත්සන් කල කාලය අවසන් වන ආකාරය අනුව කඩ ටෙන්ඩර් කරන බව ප්‍රකාශ කරන ලදි.

**ගරු උපසභාපති එච්.එම්.ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා.**

උහන ආකාරයටම කඩ අරගෙන අතුරුබදු දෙන අය වැරැන්කැටගොඩ සිටින බවත් ,උහනට වුනු දේම වැරැන්කැටගොඩටත් සිදුවෙමින් පවතින බව ප්‍රකාශ කරන ලදි.ඒ ගැන සොයා බලන ලෙස ප්‍රකාශ කරන ලදි.සභාවේ නිළධාරියෙක් යවා එය අධීක්ෂණය කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරුසභාපති තුමා.**

සභාවේ නිළධාරියෙකු යවා ඒ ගැන සොයා බැලූ අවස්ථාවේදී අතුරුබදු දී ඇති කඩ කාමරයක් හමුවූ බවත් , එම කඩ කාමරය මුද්‍රාතබා ඇති බව ප්‍රකාශ කරන ලදි.මෙම කඩ පිළිබද නැවත සමීක්ෂණයක් කර එම කඩ කාමරද මුද්‍රාතබන ලෙස ලේකම් තුමියට උපදෙස් දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

කඩ කාමර අතුරුබදු දී තිබෙනවාද යන්න තහවුරු කරගත යුතු බවත් , ග්‍රාම නිළධාරී සම්බන්ධ කරගෙන තොරතුරු සමීක්ෂණය කලයුතු බව ප්‍රකාශ කරන ලදි.

**ගරුසභාපති තුමා.**

කඩ කාමර පිළිබද සභාවට කරුණු ඉදිරිපත් කිරීම සදහා ආදායම් පරීක්ෂක කේෂර මහතාට අවස්ථාව ලබාදීම සදහා මහා සභාව කාරක සභාවක් බවට පත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.පී.ජයතිලක මහතාගේ සහ ගරු ප්‍රා.ස.මන්ත්‍රී ආර්.ඒ.ඩී.සිසිර ශාන්ත කුමාර මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභාව කාරකසභාවක් බවට පත්විය .

ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එම්.කුලතුංග මහතාගේ සහ ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ජේ.පී.සුගන්ධි ෂාවිකා මියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහා සභාවක් බවට පත්විය .

අතුරු බදු දී ඇති කඩ කාමර පවරා ගැනීම පිළිබද සාකච්ඡා කල අතර කඩ කාමර පවරා ගැනීමට බලය ලබාදෙන ලෙස ආදායම් පරීක්ෂක ඉල්ලීම් කර සිටි බැවින් ඒ සදහා සභාවේ බලය ලබා දීමට තීරණය විය.වරිපනම් බදු සම්බන්ධවද එම අවස්ථාවේ සාකච්ඡා විය. රු.7,000,000.00 ක් පමණ සභාවට අය වීමට තිබෙන බවද සදහන් විය .

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

ආදායම් පරීක්ෂක මහත්වරුන් සදහා බලය ලබා දිය යුතු බවත්, එයට අවශ්‍යය නීතිමය තත්වය ලේකම්තුමිය විසින් සොයා බලා ඔවුන්ට බලය ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.එතුමාට ලිඛිතව බලය ලබාදීම සිදුකල යුතු බවත් , සභා වාර්තාවට පමණක් සීමා නොවී එම කටයුත්ත කඩිනමින් සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ජේ.ආර්. ජගත් ප්‍රසන්න මහතා.**

වසර ගනනාවක සිට අපට අයවිය යුතු වරිපනම් මුදල විශාල බවත් ආදායම් පරීක්ෂක මහතා පැවසූ ආකාරයට ලක්ෂ 70 යනු විශාල මුදලක් බවත් , එය සභාව සතු ලොකු ආදායමක් හා ලොකු වත්කමක් බවත් , එම නිසා අප යන මොහොතේ හෝ මේ සඳහා යෝජනාවක් ලෙස ඉදිරිපත් කලයුතු බවත් , අයවිය යුතු වරිපනම් මුදල නීත්‍යානුකූල ලෙස අයකර ගැනීමට අවශ්‍යය කටයුතු සලසා දෙන ලෙස මා විසින් හදිසි යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදි.එයට අවශ්‍යය කටයුතු කිරීම සඳහා එම නිළධාරීන්ට බලය ලබා දෙන ලෙසත් ප්‍රකාශ කරන ලදි.එවිට එම නිළධාරීන් අවශ්‍යය වැඩ කටයුතු කරාවි යැයි ප්‍රකාශ කරන ලදි.

**එම යෝජනාවට අදාලව අත රුදවුම් මුදල් (Key Money) ලෙස පහල මහල සඳහා රු.200,000.00 ක මුදලක් හා ඉහල මහල සඳහා රු.100,000.00 ක මුදලක් තැන්පත් කලයුතු බවත් , ගොඩනැගිල්ල සඳහා , අ රක්ෂණාවරණය සභාව විසින් දැමීමටත් , එම රක්ෂණාවරණය සඳහා යන වියදම කඩ හිමියන් ගෙන් මාසිකව අය කර ගැනීමටත් , මාස 03 කඩකුලී රදවා නොගැනීමටත් , හා ටෙන්ඩර් පත්‍රිකාවේ එය නිවැරදිව සඳහන් විය යුතු බවටත් , තක්සේරු මුදලට අමතරව රක්ෂණ වාරික මුදලද කඩකුලී සඳහා එකතු කර කඩ හිමියන්ගෙන් ලබා ගැනීමට තීරණය විය**

**එම තීරණය එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2023/02(07)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින්,UNDP ආධාර වැඩසටහන යටතේ පුස්තකාල ස්වයංක්‍රීයකරණ වැඩසටහනේ මෘදුකාංග හදුන්වාදීමේදී අන්තර්ජාල පහසුකම් ලබා ගැනීමට හා පුස්තකාල තැන්පත් මුදලටව අමතරව වාර්ෂිකව පුස්තකාල කාඩ්පත අලුත් කලයුතු බවත් , ඒ සඳහා පාසල් ළමුන්ට රු.50.00 ක් හා වැඩිහිටියන්ට රු.100.00 ක මුදලක් අය කිරීම සඳහා සභා අනුමැතිය සඳහා යෝජනා කොට ඉදිරිපත් කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ජේ.පී. සුගන්ධි ෂාවිකා මිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.**

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මයා**

ප්‍රාදේශිය සභාවක් තුළින් ජනතාවට සේවයක් විය යුතු නිසා , අප වෙන වෙන අංශ වලින් අය කිරීම් කර වැඩිකර ගත්තාට ප්‍රශ්නයක් නැති බවත් , නමුත් පුස්තකාලය විශාල වශයෙන් පරිහරණය කරන්නේ පාසල් දරුවන් බැවින් , පොඩි මුදලකින් වැඩිකර මෙය නඩත්තු කරන්නට හැකි වේ යැයි නොසිතන බවත් , එම නිසා අපි වෙනත් ආකාරයකින් මේ මුදල සොයා ගැනීම සුදුසු බවත්, පාසල් දරුවන්ගෙන් එය අයකිරීම සුදුසු නැති බව ප්‍රකාශ කරන ලදි.පුස්තකාලයට දැනට ඇතුලත්වීමේ ගාස්තු ලෙස ගන්නා මුදල ඒ ආකාරයටම තියමු යැයි ප්‍රකාශ කරන ලදි.

**ගරුසභාපති තුමා.**

ඔබතුමාගේ අදහස පැහැදිලි බවත් , නමුත් මෙය UNDP එකේ කොන්දේසියක් බවත්,ඒවාට අප ක්‍රියාත්මක විය යුතු බවත් ප්‍රකාශ කරන ලදි. UNDP එකේ සේවය ගන්නා විට අප ඒ කොන්දේසි වලට යටත් විය යුතු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මයා**

අප සාමාජිකයෙකුගෙන් දැන් අය කරන මුදල රු.20.00 ක් නම් එය රු.50.00 දක්වා වැඩි කිරීම තුළින් අපට රු.30.00 ක් වැනි ප්‍රමාණයක් වැඩි වන බවත් , සාමාජිකයින් 200 ක් සිටින විට 200 x30 ක් වන බවත් රු.

6000.00 ක් වැනි මුදලක් පමණක් අපට ලැබෙන බවත් , එය අපට වෙනත් ආකාරයකින් සොයා ගතහැකි බව පැහැදිලි කරන ලදි.ඒ පිලිබද UNDP එක දැනුවත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ජේ.ආර්.ජගත් ප්‍රසන්න මයා.**

දෙලංකාවල මන්ත්‍රීතුමා පැවසූ දෙය සත්‍යයක් බවත් , ගොඩක් වේලාවට පුස්තකාලය පාවිච්චි කරන්නේ පොතක් තමන්ට මිලදී ගැනීමට නොහැකි පිරිසක් බවත් , පොතක් ගන්නට පුළුවන් බොහෝ දෙනෙක් පුස්තකාලවලට එන්නේ නැති බවත් , ඊට අමතරව ඉතා උනන්දුවෙන් වැඩ කටයුතු කරන ළමයි පුස්තකාලයට පැමිනෙන බවත් , ඔවුන්ගේ සාමාජික මුදල වැඩිකිරීම තුලින් ඒ දරුවන් අධෛර්යයට පත් වන බවත් පෙන්වා දෙන ලදි.ඒ වැඩි කිරීම තුළින් විශාල මුදලක් එකතු කර ගන්නට නොහැකි බවත් , එම නිසා මාගේ දීමනාවෙන් යම් මුදලක් ඒ සදහා ලබා දීමට මා කැමති බවත් ප්‍රකාශ කරන ලදි.තවද සියළුම මන්ත්‍රීවරුන්ගේ මාසික දීමනාවෙන් හැම මසකම රු.100.00 ක් හෝ රු.150.00 ක් අයකරගෙන ඒ කාර්ය කිරීමට හැකිනම් ඉතා සුදුසු බව පෙන්වා දෙන ලදි.ඒ ආකාරයට චක්‍රාකාරව මුදල් එකතු කර ගැනීමට හැකි බව පෙන්වා දෙන ලදි.පුස්තකාලයට එන දරුවන් මේ සාමාජික මුදල වැඩි කිරීම නිසා අධෛර්යයට පත්වන බව පැහැදිලි කරන ලදි. අන්තර්ජාලයට යන වියදම අපි කොහෙන් හෝ පියවා ගන්නවා නම් ගැටළුවක් නැති බව පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

අන්තර්ජාලය පරිහරණය කරන විට පුස්තකාලයට සාමාජිකයන් පමණක්ම නොව වෙනත් අයත් පැමිනෙන බවත් , ඔවුන් හිතුමනාපයට මෙම අන්තර්ජාල පහසුකම භුක්තිවිදිය හැකි බවත් ,ඒ ගැනත් අධීක්ෂණයක් තිබිය යුතු බවත් පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මයා.**

යහපාලන ආණ්ඩුකාලයේ තදාසන්න ප්‍රදේශවල වයිෆයි පහසුකම් සලසා දුන් බවත්, මුහුණු පොත හා වට්ස්ඇප් යන්න පුළුවන් වුවාට යම් දෙයක් බාගත කරගන්න(ඩවුන්ලෝඩ්) කරගන්න බැරි බවත්,යම් GB ප්‍රමාණයක් පමණක් ලබාදුන් බවත් පැහැදිලි කරන ලදි. වයිෆයි පහසුකම් සීමාකර ලබාදුන් බව ප්‍රකාශ කරන ලදි.ඒ ආකාරයට අපගේ පද්ධතියත් සීමා කර හසුරුවා ගතයුතු බව ප්‍රකාශ කරන ලදි.එසේ නොකර නිදහසේ පරිභෝජනය කරන්න දුන්නොත් අපි අමාරුවේ වැටෙන බව පෙන්වා දෙන ලදි.සීමා සහිත GB ප්‍රමාණයක් ලබාදියයුතු බව පෙන්වා දෙන ලදි.මෙය නිවැරදි ආකාරයට සිදුකල යුතු බව පැහැදිලි කරන ලදි.

**ගරු උපසභාපති එච්.එම්.ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා.**

සාමාජික වුනු දරුවෙක්ගේ සාමාජික ගාස්තු පිලිබද ප්‍රශ්නයක් මෙතන නැති බවත් , අන්තර්ජාල පහසුකම් සදහා ගැටළුවක් තිබෙන බවත් , දරුවන් වෙනුවෙන් අපි පෙනීසිටිය යුතුයැයි අමුතුවෙන් පෙන්විය යුතු නොමැති බවත් , දැනට ගත්විට අවුරුදු 07 - 08 ළමුන්ගේ ලග පවා ජංගම දුරකතන තිබෙන බවත් , දැන් 08, 09, 10, පන්තිවල සිසුන් අන්තර්ජාලය හසුරුවන බවත් ඔවුන් දිනකට රු.50.00 ක් හෝ රු.100.00 ක් ඩේටා කාඩ් දමා ගන්නා බවත් පැහැදිලි කරන ලදි.එම නිසා මේ යෝජනාව ගැන මහා ලොකුවට කතාවිය යුතු නැති බවත් ප්‍රකාශ කරන ලදි.මාගේ දීමනාව මේ සදහා ලබාදීමට කැමති බවත් ප්‍රකාශ කරන ලදි.මේ රු.50.00 ක මුදල ලබා ගන්නේ අවුරුද්දකට වතාවක් බවත් , මේ ගැන මේ තරම් තර්ක කිරීමට අවශ්‍යය නැති බව ප්‍රකාශ කරන ලදි. අවුරුද්දකට වතාවක් ර.50.00 ක් දෙන්න බැරි කෙනෙක් සිටිනවායැයි මා නොසිතන බවත් ප්‍රකාශ කරන ලදි.එම නිසා පාසල් දරුවන්ගෙන් අවුරුද්දකට රු.50.00 ක් හා වැඩිහිටියෙකුගෙන් අවුරුද්දකට රු.100.00 ක මුදලක් ලබා ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මයා.**

කෙලින්ම මට චෝදනා කලායැයි සිතන බවත්, අප විසින් ප්‍රාදේශීය සභාව නඩත්තු කරන්නට අවශ්‍යය නැති බවත් , අප සිටින්නේ ප්‍රාදේශීය සභාව තුළින් ජනතාවට සේවය කිරීමක් සිදු කරන්නට යැයි ප්‍රකාශ කරන ලදි.අප මීට පෙර යම් යම් ළමුන් තෝරාගෙන මන්ත්‍රීවරු හරහා ශිෂ්‍යත්ව ක්‍රමයක් ක්‍රියාත්මක කල බවත් , සභාවේ අනවශ්‍යය වියදම් කොපමණ සිදුවනවාදැයි විමසන ලදි.එමනිසා රු.6000.00 ක් යනු මේ කාලයේ හැටියට සුළු මුදලක් බවත් පෙන්වා දෙන ලදි.මෙම රු 50.00 ක මුදල ළමයකුට දෙන්නට බැරිකමක් නැතිබව සත්‍යය බවත් , නමුත් ප්‍රාදේශීය සභාවෙන් ජනතා මෙහෙවරක් සිදු කරනවානම් මෙය අධ්‍යාපනයට සම්බන්ධ කටයුත්තක් බැවින් සභාව හරහා නොමිලේ ලබා දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.මෙය ලකුණු දමා ගැනීමට කල කතාවක් නොවන බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්.එච්.ලාල් ජයන්තසිරි මයා.**

කොරෝනා කාලය එනතුරුම මාගේ දීමනාවෙන් රු.1500.00 ක මුදලක් මා විසින් පුස්තකාලයට ලබාදුන් බවත්, තරඟ සංවිධානය කර ළමුන්ට ත්‍යාග ලබා දීමක් සිදුකල බව ප්‍රකාශ කරන ලදි.මේ කටයුත්තත් තමන් කැමතිනම් කරන්නට පුළුවන් බව ප්‍රකාශ කරන ලදි.

**ගරුසභාපති තුමා.**

පුස්තකාලයේ සියළුදේම නොමිලේ කර දීමට ගියවිට ළමුන්ට එය දැනෙන්නේ නැති බවත් , පුස්තකාලය පරිහරණය කිරීමේදී කිසිම වගකීමක් නැතිව කටයුතු කරන බවත් , එම නිසා පුස්තකාල සාමාජිකයින් පුස්තකාල පොත් රැගෙනගිය විට නැවත භාරදීම සිදු නොකර සිටින බවත් , එම හේතු නිසා පසුගිය කාලයේ රාජකාරී කල සමහර සේවකයින්ට අධිභාර ගෙවීමට සිදුවී ඇති බවත් , පෙන්වා දෙන ලදි.එසේම රෝහන මන්ත්‍රීතුමා පැවසූ අදහස ඉතා හොඳ අදහසක් බවත් ප්‍රකාශ කරන ලදි.

**මෙම යෝජනාවෙහි සඳහන් පරිදි පාසල් දරුවන්ගෙන් අවුරුද්දකට රු.50.00 ක් හා වැඩිහිටියෙකුගෙන් අවුරුද්දකට රු.100.00 ක මුදලක් අයකර පුස්තකාල කාඩ්පත අවුරුද්දකට වරක් අලුත් කිරීම සුදුසු බව තීරණය විය**

**එම තීරණය එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සම්මත විය.**

ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 11.50 තේ විවේකය සඳහා සභාව කල් තබන ලදි

ඔරලෝසු වේලාවෙන් ප.ව. 12.30 තේ වවේකයෙන් පසුව නැවත සභාව ආරම්භ කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් ප.ව.12.30 ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ඒ.නන්දිකා ප්‍රියන්ති කුමාරි මිය පිටවී යන ලදි.

**යෝජනා අංක 06/2023/02(08)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින්,උහන සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු ආහාර සාම්පල් පරීක්ෂාව සඳහා මාසිකව එක් අයෙකුට රු.1000.00 ක් බැගින් අත්තිකාරම් ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති බැවින් ඒ සඳහා සභා අනුමැතියට යෝජනා කොට ඉදිරිපත් කරන ලදි .

H.M.A.K. බණ්ඩාර.
මහජන සෞඛ්‍ය පරීක්ෂක,
වෙලිකැන්ද,
2023.01.02.

Medical Officer of Health
02 JAN 2023
Uhana

ප්‍රාදේශීය සභාව
03 JAN 2023
උහන.

.01/08

පරිපාලන ම.සෞ.ප. මගින්,
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මගින්,
ගරු සභාපති,
ප්‍රාදේශීය සභාව,
උහන.

6 [illegible]
4 [illegible]

2023 වර්ෂයේ ආහාර සාම්පල් ලබා ගැනීම සම්බන්ධවයි.

උහන [illegible] සම්බන්ධව උහන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී බල ප්‍රදේශයේ වෙලිකැන්ද ම.සෞ.ප. කොට්ඨාසයේ 1980 අංක 26 දරන ආහාර පනත ක්‍රියාත්මක කිරීමේදී ආහාර පරීක්ෂණය සඳහා ලබා දීමට ආහාර සාම්පල් ලබා ගැනීමට අදාළව වාර්ෂිකව රුපියල් 1000/= ප්‍රතිපාදනයක් ලබා දෙන ලෙසත් සහ එම මුදල කාර්යාලයට ලබා දී [illegible] මුදල් [illegible] [illegible] [illegible] ලැබීම සඳහා ලබා දිය යුතු ආහාර සාම්පල් ලබා දෙන ලෙසත් ඉල්ලමි.

මෙයට විශ්වාසී,

ආහාර සාම්පල් ලබාගැනීම සඳහා අවශ්‍ය මුදල් ලබාගැනීම සඳහා කටයුතු කිරීමට අනුමැතිය යොමු කරමි.

SPHI
02/01/2023.

අනුමැතිය සඳහා උහන ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාට යොමු කරමි

2/1/2023

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ...
උහන

P.H.I. [illegible] තෙන්නකෝන්,
මහජන සෞඛ්‍ය පරීක්ෂක,
නිවිදුරාව,
2023.01.02.

පරිපාලන මා:සෞ:ප: මගින්,
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ~~[illegible]~~ මගින්,
ගරු සභාපති,
ප්‍රාදේශීය සභාව,
උහන,

Medical Officer of Health
02 JAN 2023
Uhana

01/10

ප්‍රාදේශීය සභාව
03 JAN 2023
උහන.

2023 වර්ෂයේ ආහාර සාම්පල් ලබා ගැනීම සම්බන්ධවයි.

උක්ත කරුණ සම්බන්ධව උහන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී බල ප්‍රදේශයේ නිවිදුරාව මා:සෞ:ප: කොට්ඨාශයේ 1980 අංක 26 දරන ආහාර පනත ප්‍රකාරව ප්‍රදේශයේ ආහාර [illegible] කරනු ලැබේ. එහිදී ආහාර සාම්පල් ලබා ගැනීමට මුදලක් මාසික රුපියල් 1000ක දීමනාවක් ලබා දෙන ලෙසත් එම මුදල [illegible] වසරකට වරක් ගෙවන් එම මුදල බිල් පත් [illegible] ප්‍රතිපූරණය කර [illegible] ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් ඉල්ලමි.


මෙයට
විශ්වාසී

[signature]

ආහාර සාම්පල් ලබා ගැනීම සඳහා ප්‍රතිපාදන මුදල් [illegible]
[signature]
[illegible]
02/01/2023

Approved
[signature]
2/1/2023

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය



සඳරුවන්,
පවුල් සෞඛ්‍ය සේවිකා,

මහජන සෞඛ්‍ය පරීක්ෂක,
මගින්,

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,
මගින්,

ගරු සභාපති තුමා,
ප්‍රාදේශීය සභාව,
උහන,
2023/01/02,

Medical Officer of Health
02 JAN 2023
Uhana

ප්‍රාදේශීය සභාව
03 JAN 2023
උහන.

04/09

2023 වර්ෂයේ දී ... ලියා ගන්නා ආහාර සාප්පු ... සඳහා ... උහන ප්‍රාදේශීය සභාව මගින් ලියා පදිංචි ... රු: 1000/- ක ... කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

මීට,
විශ්වාසී,

02/01/2023.

Approved
2/1/2023

ගරු ප්‍රා.ස.මන්ත්‍රීනී ඊ්.ආර්.සුමනාවතී මිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු සඳහා මාගේ කාලයේත් ආහාර සාම්පල් මිලදී ගැනීම සඳහා දීමනාවක් ගෙවූ බවත් , ආහාර සාම්පල් මිලදී ගෙන පරීක්ෂාකර යම් ගැටළුවක් පැවතුන හොත් උසාවි දමා අයකරන ලද දඩ මුදල 100% ක්ම අපට ලැබෙන බව ප්‍රකාශ කරන ලදි.අපි රු.1000.00 ක් වියදම් කලත් යම් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙක් නඩු පහක් හෝ දැමුවොත් එයින් ලැබෙන දඩ මුදල සභාවට  ලැබෙන බව සත්‍ය බවත් , නමුත් මෙහි ගැටළුවක් තිබෙන බවත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු මොනවා හෝ භාණ්ඩ ටිකක් වෙළඳසල් වලින් ලබාගෙන බිල්ටික ලියා දමා මුදල් ලබාගන්නා බවත් , එතනින් එහාට සභාවවත් ඒ පිලිබඳව සොයා නොබලන බවත් පැහැදිලි කරන ලදි. රු.1000.00 ක් අප විසින් වියදම් කර ඇති බැවින් එම රු. 1000.00 අපට ලැබී තිබෙන අවසන් ප්‍රතිඵලය කුමක්ද යන්න සොයා බැලිය යුතු බව පැහැදිලි කරන ලදි.එසේ සොයා බැලීමට සභාපතිතුමාට හා ලේකම්තුමියට අයිතියක් තිබෙන බවත් පෙන්වා දෙන ලදි. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු බිල් ටික ලියා දමා සභාවෙන් මුදල් ලබා ගැනීම සිදුවන බවත් , භාණ්ඩ මිලදී ගැනීමක් සිදුවූවාද වත් අප නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදි.එම නිසා අප විසින් මෙයට කල යුත්තේ ඔවුන් ලබා දී ඇති දායකත්වය සොයා බැලීම බව ප්‍රකාශ කරන ලදි.වාර්ෂිකව දිය හැකි මුදල සභාවේ අයවැය ලේඛනයේ සඳහන්ව ඇති බවත් ප්‍රකාශ කරන ලදි.අප විසින්  ඒ සඳහා ලබා දී ඇති දායකත්වය ඔවුන්ගෙන් ලබාගතයුතු බව පෙන්වා දෙන ලදි.ඒ සඳහා අපට දායකත්වය ලබා දී නොමැති නම් අප විසින් රුපියලක්වත් ගෙවියයුතු නැති බව පැහැදිලි කරන ලදි .එසේම සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලයෙන් පසු විපරමක් කලයුතු බවත් , උහන බල ප්‍රදේශයේ කොපමණ වැටලීම් කර තිබෙනවාදැයි දත්ත ලබා ගත යුතු බව පැහැදිලි කරන ලදි.එසේම පනතේ සඳහන් වෙන්නේ මහජනයාගේ සෞඛ්‍ය ආරක්ෂාකිරීම සභාවේ වගකීමක් බවයි.එමනිසා එය රු.1000.00 කට ලඝුකල නොහැකි බවත් ,මහජන සෞඛ්‍ය යටතේ පනතේ අපට බලතල දී ඇති බැවින් මෙය අප විසින් ක්‍රියා කල යුතුම බවද පෙන්වා දෙන ලදි.උහන සභාවට ඔවුන්ගේ දායකත්වය කොපමණ ලබා දී තිබෙනවාද යන්න සොයාබලා , අපි ස්වයංව ගත්විට සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලයෙන් අපට ලබාදෙන දායකත්වය ඉතා වැදගත් බවත් , ගොඩනැගිලි අයදුම්පත්‍ර සැකසීම , පරිසර බලපත්‍ර ලබාදීමේදී අපට සහයෝගය තිබිය යුතු බවත් , අන්නෝන්‍ය සම්බන්ධතාවය ඇතිව මේ ගමන යායුතු බවත් පැහැදිලි කරන ලදි.අප ලබාදෙන මුදලට සමගාමීව මේ කාර්ය සාර්ථකව සිදුවිය යුතු බව පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මයා.**

මෙතනදී බැලූ විට අපි ආයතන දෙකක් බවත් , නමුත් බොහෝ අවස්ථාවල අපි එකට වැඩකරන අවස්ථා තිබෙන බවත් , අනිත් ආයතන හා මේ ආයතන දෙක ගත් විට බොහෝ අවස්ථාවල වරින් වර ගැටෙන තත්වයක් තිබෙන ආයතන දෙකක් බවත් , එයට විශේෂම හේතුව ලෙස මා දකින්නේ ඔබතුමාගේ බලය පවා අධික්‍රමණය කර එහි නිළධාරීන් වැඩ කටයුතු කල බවත් , මුළු ප්‍රාදේශීය සභාවම හැල්ලුවට ලක් කරමින් ඔවුන් කටයුතු කල බවත් පෙන්වා දෙන ලදි.ඒ අවස්ථාවේදී සෞඛ්‍ය අංශය මූලිකව වැඩකල බව පෙන්වා දෙන ලදි.සෞඛ්‍ය සම්බන්ධව පැන නගින ගැටළු අපේ ප්‍රාදේශීය සභාවෙන් නිරාකරණය කිරීම සිදුවන බවත් , ප්‍රදේශයේ කැලි කසල ටික ක්‍රමවත්ව රැගෙන විත් බැහැර කිරීම සිදුවන බවත් , සෞඛ්‍ය සම්බන්ධව පැනනගින ගැටළු වලට නිවැරදි විසඳුම් සොයා ප්‍රාදේශීය සභාවක් ලෙස ඉදිරියට යන බවත්  මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු ඔවුන්ගේ රාජකාරිය හරියට සිදුකල යුතු බවත් , ඔවුන්ගේ රාජකාරියට අප විසින් ගෙවීමක් සිදු නොකලයුතු බවත් , පැහැදිලි කරන ලදි.ඔවුන්ට සියළුම දීමනා ඔවුන්ගේ ආයතනයෙන් ලැබෙන බවත් , රට මේ තරම් අගාධයකට වැටිලා තිබෙන මොහොතක මෙවැනි ඉල්ලීමක් කිරීම වැරදි සහගත බවත් ,මාගේ පෞද්ගලික අදහස නම් මේ දීමනාව ලබා දීමට සුදුසු නැති බවත් පැහැදිලි කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

දෙලංකාවල මන්ත්‍රීතුමාගේ අදහසට මා විරුද්ධ නොවන බවත් , නමුත් ගැටළුවක් පවතින බවත් , අපේ ලේකම්තුමියගේ දීමනා ගෙවීම සම්බන්ධව කතා කිරීමේදී පැවසූ පරිදි ඔවුන් ඉල්ලා සිටින්නේ මේ ප්‍රදේශයේ සෞඛ්‍ය සම්බන්ධ ගැටළුවකට විසඳුමක් ලබා දීමට ආහාර සාම්පල් ලබා ගැනීම සඳහා බවත් පැහැදිලි කරන ලදි.මෙය ඔවුන්ගේ දීමනාවක් ලෙස ඉල්ලා නොසිටින බවත් , ආහාර සාම්පල් ලබා ගැනීම සඳහා මේ මුදල ඉල්ලා සිටින බවත් , පැහැදිලි කරන ලදි.මේ මුදල අප විසින් ලබා දිය යුතුමයි.එය ගැටළුවක් තිබෙන බව

පැහැදිලි කරන ලදි.මෙය මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ පෞද්ගලික අවශ්‍යතාවයකට නොඉල්ලන බවත් ,සභාවෙන් සිදුවියයුතු කාර්යයක් සඳහා ඔවුන්ගේ මැදිහත් වීමෙන් මෙය සිදුවන බවත් පැහැදිලි කරන ලදි.මුදල් නිකුත් කලාට පසු නඩු කොපමණ දැම්මාද යන ප්‍රථිඵලය සොයා බැලිය යුතු බව ප්‍රකාශ කරන ලදි.එයින් ලැබෙන ප්‍රථිඵලය සාර්ථකනම් පමණක් ඉදිරියට ඒ සඳහා දීමනාව ලබා දීම සිදු වූවාට ගැටළුවක් නැති බවත් ප්‍රථිඵලයක් නොමැතිනම් එය නවතා දමන ලෙසත් ප්‍රකාශ කරන ලදි.

**ආහාර සාම්පල් පරීක්ෂාව සඳහා අත්තිකාරම් මුදල් ගෙවීමට පනතේ සඳහන්ව ඇද්දැයි අධීක්ෂණය කර පලාත් පාලන සහකාර කොමසාරිස් මගින් පලාත් පාලන කොමසාරිස්ට ලිඛිතව යොමු කර අනුමැතියක් ලබා ගැනීමට තීරණය විය.**

**එම තීරණය එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2023/02(09)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින්,ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කිරීම සම්බන්ධයෙන් පැවති මාර්ග ගත සාකච්ඡාව මගින් සාකච්ඡාකරගත් පරිදි උහන ප්‍රාදේශිය සභාවේ ඝන අපද්‍රව්‍ය අම්පාර නගර සභාව වෙත ඉදිරියේදී භාර නොදී අප ආයතනයට අයත් ඝන අපද්‍රව්‍ය දැමීමට සුදුසු ස්ථානයක් සකස්කර ගන්නා ලෙස දැනුම් දුන් අතර එයට සුදුසු ස්ථානයක් යෝජනා කරන මෙන් ගරු සභාවට යෝජනා කොට ඉදිරිපත් කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.**

**ගරුසභාපති තුමා.**

නුගේලන්ද අවට ඉඩමක් වෙන්කර ඇති බවත්, එය සකස්කර ගන්නා තුරු අම්පාර නගර සභාවට ඝන අපද්‍රව්‍ය ලබාදීම සිදුවන බවත් , නුගේලන්ද අවට ඉඩම සකස්කර ගත් පසු එයට ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සිදුවන බවත් ප්‍රකාශ කරන ලදි.

**නුගේලන්ද අවට ඉඩම ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසු බව සභාවෙන් තීරණය විය.**

**එම තීරණය එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2023/02(10)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින්,ආදේශක විදුලි කාර්මික වශයෙන් සේවය කරන ආර්.එම්. සුධීර සම්පත් මහතා විසින් රක්ෂණාවරණයක් හා ආයුධ කට්ටලය හා ආරක්ෂිත ඇඳුම් ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර ඇති බැවින් ඒ සඳහා සභා අනුමැතියට යෝජනා කොට ඉදිරිපත් කරන ලදි

R.M. සුජීව සමන්,
මන්ත්‍රීවරයා,
ප්‍රාදේශීය සභාව,
උහන,
2023.02.09.

ගරු සභාපතිතුමා,
ප්‍රාදේශීය සභාව,
උහන.

රක්ෂණාවරණය ලබා ගැනීම සම්බන්ධව.

ඉහත නම සඳහන් මා දැනට උහන ප්‍රාදේශීය සභාවේ ආදේශක විදුලි කාර්මික වශයෙන් සේවය කරන අතර මා අවදානම් සහිතව විදුලි බල්බ සවි කරන අතර මාගේ ජීවිත ආරක්ෂාව වෙනුවෙන් මා හට රක්ෂණාවරණයක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙනමෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.

පහත සඳහන් උපකරණද මා හට ලබා දෙන්න.

I වයර් ඇදීම කරන කටින් අඬුව.
II ආරක්ෂිත සපත්තු ජෝඩුවක්

ස්තූතියි,
මෙයට - විශ්වාසී,
Su

ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එම්.කුලතුංග මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.


**ගරු උපසභාපති එච්.එම්.ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා.**

අවශ්‍යය භාන්ඩ කට්ටලය හා ඇඳුම් හා සපත්තු ලබාදීම සිදුවියයුතු බව ප්‍රකාශ කරන ලදි.

**එම අවස්ථාවේ පැමිණ රැදී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යෝජනාව ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2023/02(11)**

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඒ.ලලිත් කුමාර මහතා විසින් මධ්‍යම කදවුර රෝහලට ඉන්ධන සහනයක් ලබා ගැනීම සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන යෝජනාව.



MINISTRY OF HEALTH
RDHS REGION - KALMUNAI
ප්‍රාදේශීය රෝහල - මධ්‍යම කඳවුර
பிரதேச வைத்தியசாலை–மத்திய முகாம்
DIVISIONAL HOSPITAL – CENTRAL CAMP

Telephone:063-2051750 Fax:063-2051750 email:dhcentralcamp@gmail.com

ගරු ප්‍රාදේශීයසභා මන්ත්‍රී
ඒ. ලලිත් කුමාර මහතා මගින්
ප්‍රාදේශීය සභාව
උහන

**ඉන්ධන(ඩීසල්) සහනයක් ලබාගැනීම සම්බන්ධවයි**


මෙ දිනවල සිදුකරන විදුලි කප්පදුව හේතුවෙන් අපගේ ප්‍රාදේශීය රෝහලේ නිතර විදුලි ඇනහිටීම් සිදුවන අතර සේවාවන් ලබාගැනීම සඳහා පැමිණෙන රෝගීන් දැඩි දුෂ්කරතාවයන්ට මුහුණපා සිටී.

අප රෝහලේ ප්‍රතිකාර ලබාගැනීම සඳහා උහන ප්‍රාදේශීයසභා බල ප්‍රදේශයට අයත් අංක 21, 20, 19, 8, 17, 16, 10, 9, 3, 26 යන ජනපද වාසීන් පැමිනෙන අතර රෝහලට ලැබී ඇති විදුලි ජනක යන්ත්‍රය (Generator) ක්‍රියාකරවා හෝ ඔවුන්ට අවශ්‍ය සේවාවන් සලසා දියහැකි නමුත් ඒ සඳහා අවශ්‍ය ඉන්දන සපයා ගැනීමට අරමුදල් නොමැති බැවින් සේවා කටයුතු අඩාලව පවතී.

එබැවින් ප්‍රාදේශීය සභාවෙන් පරිත්‍යාගයක් ලෙස යම් මුදලක් ලබාදීමට කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

ප්‍රාදේශීය වෛද්‍ය නිලධාරී
ප්‍රාදේශීය රෝහල
මධ්‍යම කඳවුර

DMO
Divisional Hospital
Central camp



ප්‍රාදේශීය සභාව
30 JAN 2023
උහන.

2023/01/30

ගරු ලේකම්
ප්‍රාදේශීය සභාව,
උහන.

යෝජනා ඉදිරිපත් කිරීම

මෙයට

ඒ. ලලිත් කුමාර
ප්‍රාදේශීය සභා මන්ත්‍රී
උහන ප්‍රාදේශීය සභාව
දඩයම්තලාව
✆ 077 60 61 298

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ආර්.ඒ.ඩී.සිසිර ශාන්ත කුමාර මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.**

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඒ.ලලිත් කුමාර මහතා.**

මධ්‍යම කඳවුර රෝහල පසුගිය වකවානුවේ ඉතාම අරාජික තත්වයකට පත්වී තිබූ රෝහලක් බවත් ,යුද්ධය අවසන් වීමත් සමගම රෝහල දැන් යථා තත්වයට පත්වෙමින් තිබෙන බවත් , දියුණුව කරා යමින් තිබෙන නමුත් රජයේ ප්‍රතිපාදන මුදල් ලැබීම් බොහෝදුරට කප්පාදු කිරීම නිසා පහසුකම් අඩුවී ඇති බව පැහැදිලි කරන ලදි.එම රෝහලේ රොහල් කමිටුව නියෝජනය කරන නියෝජිතයකු ලෙස මම පසුගිය කාලයේ එම රෝහලේ අක්‍රියව තිබූ බොහෝ දේවල් ප්‍රදේශයේ පරිත්‍යාගශීලීන්ගේ දායකත්වය මත සක්‍රීය කර ගැනීමට හැකිවූ බවත් පෙන්වා දෙන ලදි රෝහලේ ගිලන් රථය ගාල්කර තිබූ බවත් , ප්‍රදේශයේ ජනතාව සමග එකතු වී රු.180000.00 ක් වැනි මුදලක් වියදම් කර එම ගිලන් රථය යථා තත්වයට පත්කර ධාවනයට යොමුකල බවත් , එසේම විදුලිජනක යන්ත්‍රයක් එහි නොතිබූ බවත් , දිනක් රාත්‍රී 8.00 පමණ රිය අනතුරක් වී රෝගියෙකු රැගෙන ආ මොහොතක විදුලිය විසන්දි වී තිබූ බැවින් වෛද්‍යවරුන්ගේ ජංගම දුරකථනයේ විදුලි පන්දම භාවිතා කර හිසට මැහුම් දැමූ බවත් මා එම මොහොතේ එහි සිටි බැවින් අත්දැකීම් ඇති බවත් ප්‍රකාශ කරන ලදී. එහිදී අපහසුතාවයකට පත්වූ බවත් පසු දිනම අප කමිටුව රැස්වී චාර්ජ් කරන බල්බ් 04ක් රෝහලට ලබා දුන් බවත් එය දැනට භාවිතා කරන බවත් ඉන්පසු පරිත්‍යාගශීලීයෙක්ගෙන් විදුලි ජනක යන්ත්‍රයක් ලැබුණු බවත් නමුත් එයට ඉන්ධන ලබා ගැනීමට රජයේ ප්‍රතිපාදන වල හැකියාවක් නොමැති බවත් එමනිසා විවිධ ක්‍රම මඟින් ඉන්ධන ලබා ගත් බවත් ජනවාරි මාසයේ නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඉන්ධන ලීටර 50 කට ප්‍රතිපාදන ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී. මේ මාසයේ කොහෙන්වත් ඉන්ධන ලැබී නොමැති බවත් එමනිසා වෛද්‍ය නිලධාරීතුමා මාගෙන් ඉල්ලීමක් කර ඉන්ධන ඉල්ලා සිටියේ උහන ප්‍රාදේශීය සභාවෙනුත් යම් පරිත්‍යාගයක් ලබා දෙන ලෙසයි. ලොකු වියදමක් අපට දැරීමට නොහැකි වුවත් දින දෙක තුනකට හෝ විදුලි ජනක යන්ත්‍රය ක්‍රියාත්මක කර ගැනීම සඳහා යම් උපකාරයක් කිරීමට හැකිනම් බැලීම සඳහා මාගේ යෝජනාවක් ලෙස ඉදිරිපත් කර බව ප්‍රකාශ කරන ලදී. මෙහිදී යම් යම් ගැටළු පැන නැගිය හැකි බව මා දන්නා බවත් සභාවේ අරමුදල් තත්ත්වය ගැන හා අපහසුතා ගැන මා දන්නා බවත් මේ තුලින් අපට කිසිම ආදායමක් නොලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී. මන්ත්‍රීවරුන්ගෙන් තුනෙන් එකක් පමණ මේ රෝහලෙන් ප්‍රතිකාර ලබන බව මා දන්නා බවත් නමුත් මෙය නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවට අයත් භූමියක පිහිටා ඇති බව පෙන්වා දෙන ලදී. නමුත් මෙයින් වැඩි ප්‍රමාණයක් ප්‍රතිකාර ගන්නේ අපේ සිංහල ජනතාව බව පෙන්වා දෙන ලදී. එමනිසා නීත්‍යානුකූල බාධා නොතිබෙනවානම් මේ ගැන සොයා බලා යම් සහනයක් සලසා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. අපට හැකි පමණින් යම් පරිත්‍යාගයක් කළ හැකි නම් කිරීම සුදුසු බව මාගේ යෝජනාවෙන් ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.ජී. ජයතිලක මහතා.**

සියලුම දෙනාගෙන් අවසර ගත් බවත් ලලිත් මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව පිළිබඳ අපිත් අදහසක් දැක්විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. අපේ ප්‍රදේශයේ මේ රෝහල පිහිටා නැති වුවත් වීරගොඩ ප්‍රදේශයේ සිංහල ජනතාව මේ රෝහල තුලින් විශාල වශයෙන් සේවය ලබා ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී. එතුමා පැවසූ ආකාරයට එතුමා මැදිහත් වී එම රෝහලට විශාල වශයෙන් උදව් උපකාර සිදු කළ බව අපද දන්නා බව ප්‍රකාශ කරන ලදී. එසේම මම ඒ රෝහලට ගිය අවස්ථාවක වෛද්‍ය අධිකාරිතුමා මා සමඟ පවසා සිටියේ නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා උදව් උපකාර කළ බවයි. ලලිත් මන්ත්‍රීතුමා උදව් උපකාර කරන බව අප සමඟ පවසා සිටි බව ප්‍රකාශ කරන ලදී. සෞඛ්‍ය පිළිබඳ කතා කරන විට අපට ජනතාවගේ සෞඛ්‍ය පිළිබඳ ලොකු කාර්යය භාර්යක් තිබෙන බවත් වීරගොඩ ප්‍රදේශයේ සිට අම්පාර රෝහලට යාමට විශාල කාලයක් හා වියදමක් දැරීමට සිදුවන බවත් නමුත් මධ්‍යම කඳවුර රෝහලට ඉතා කඩිනමින් හා අඩු වියදමකින් යා හැකි බවත් පෙන්වා දෙන ලදී. එමනිසා මෙම කාර්ය සඳහා අපට යම්කිසි දායකත්වයක් යම්කිසි උපකාරයක් කිරීමට හැකිනම් ජනතාව පැත්තෙන් බලා ජනතා නියෝජිතයන් ලෙස අපට යම් දෙයක් කරන්නට හැකිනම් එය කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. මේ රෝහල යුද්ධය නිසා කාලයක් අඩපන වී තිබූ බවත් දැන් එය යථා තත්ත්වයට පත්වී ඇති බවත් පසුගිය කාලයේ නුවන් වෛද්‍යවරයා කටයුතු කරගෙන ගිය බවත් දැන් ඉසුරු වෛද්‍යවරයා වැඩකටයුතු කරගෙන යන බවත් ප්‍රකාශ කරන ලදී. අත්තටම කාගේ හෝ උදව් උපකාර ලබා ගෙන මේ රෝහල දියුණු කිරීමට එතුමාට උවමනාවක් පවතින බවත් ප්‍රදේශයේ ජනතාවට සෞඛ්‍ය පැත්තෙන් ඉටු විය යුතුකම් කොටස ඉටු කිරීමට විශාල උත්සාහයක පසුවන බවත් ප්‍රකාශ

කරන ලදී. එමනිසා ප්‍රදේශයේ මන්ත්‍රීවරයෙකු ලෙස මමත් ඔබ සියලු දෙනාගෙන් මේ කටයුත්තට සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්. අමරකීර්ති මහතා.**

ගරු සභාපතිතුමනි, මා හිතවත් සහෝදර ලලිත් මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාවට මමත් වචන දෙක තුනකින් හෝ සහයෝගයක් දිය යුතු යැයි සිතූ බවත් මීට වසර ගණනාවකට පෙර අප පදිංචි වී සිටියේ වීරගොඩ ප්‍රදේශයේ බවත් මමත් මෙලොව එළිය දැක තිබෙන්නේ එම රෝහලේ දී බවත් පසුගිය කාලයේ ත්‍රස්තවාදී කරදර නිසා එම රෝහල විශාල ලෙස අභාවයට පත්වී ගොස් තිබූ බවත් නමුත් පසුගිය කාලයේ රෝහල යථා තත්ත්වයට පත්වී වෛද්‍යවරුන් 04 කු පමණ එහි සේවය කරන බවත් ජනතාවට සේවයක් වෙනවානම් අප ඉතාමත් කැමති බවත් ප්‍රකාශ කරන ලදී. ලලිත් මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාවට දින කීපයකට හෝ ඉන්ධන ප්‍රමාණයක් ලබා දිය හැකි නම් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් කරන විශාල මෙහෙවරක් වන බවත් එමඟින් ඉතාමත් ඕනෑකමින් මේ කටයුත්ත කරනවානම් ඉතා සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ජේ.පී. සුගන්ධි ෂාවිකා මිය**

ලලිත් මන්ත්‍රීතුමා මෙවැනි යෝජනාවක් ගෙන ඒම ගැන බෙහෙවින් ස්තූතිවන්ත වන බවත් ගෙදරක විදුලිය යනවාට වඩා විශාල සේවයක් වන මෙවැනි ස්ථානයක විදුලිය විසන්ධි වූවාට පසු විශාල අපහසුතා රැසකටම මුහුණ දෙන බවත් එමනිසා මෙයට සහනයක් ලෙස ඉන්ධන යම් ප්‍රමාණයක් ලබා දිය හැකි නම් ඉතා සුදුසු බව ප්‍රකාශ කරන ලදී. වීරගොඩ ප්‍රදේශයේ ජනතාවට යම් හදිසි අසනීපයකදී අම්පාරට යාමෙට සිදු වූ විට කාලය ගොඩක් වැය වන බවත් එවැනි අවස්ථාවල ක්ෂණිකව මධ්‍යම කඳවුර රෝහල බෙහෙවින් ප්‍රයෝජනවත් වන බවත් ප්‍රකාශ කරන ලදී. මෙය නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවට අයත් අපේ ප්‍රාදේශීය සභාවෙන් ඉන්ධන සුළු ප්‍රමාණයක් හෝ ලබා දිය හැකි නම් එය මහඟු පුණ්‍යකර්මයක් බව ප්‍රකාශ කරන ලදී. මේ සඳහා සියලුම දෙනාගේ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ. ප්‍රේමසිරි මහතා.**

ලලිත් මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාවට මාගේ කැමැත්ත ප්‍රකාශ කරන බවත් යම් උපකාරයක් කිරීමට සභාවට හැකිනම් එසේ කරන ලෙසත් නොමැති නම් පෞද්ගලිකව හෝ එකතුවී යම් උපකාරයක් කළ හැකි නම් එය ඉතා සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ආර්.ඒ.ඩී. සිසිර ශාන්ත කුමාර මහතා.**

ලලිත් මන්ත්‍රීතුමා අගන ආ යෝජනාව මා විසින් ස්ථිර කළ බවත් මමත් එම යෝජනාව පිළිබඳව වචන කීපයක් කතා කළ යුතු බව මා සිතන බව අපගේ බල ප්‍රදේශයට අයිති වුනේ නැතත් නාවිදන්වෙලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක පිහිටා තිබුනත් එම රෝහලෙන් වැඩි ප්‍රතිලාභ ලබන්නේ උහන බල ප්‍රදේශයට අයත් සිංහල ජනතාව බව පෙන්වා දෙන ලදී. එසේම අපේ ලලිත් මන්ත්‍රීතමා විශාල සමාජ මෙහෙවරක යෙදෙන මන්ත්‍රීවරයෙකු ලෙස මෙතුමා මධ්‍යම කඳවුර රෝහලේ රෝහල් කමිටුවේ සාමාජිකයෙකු ලෙස කාර්යය භාර්යයන් රැසක් කරන බවත් මෙම මධ්‍යම කඳවුර රෝහලේ අඩුපාඩු පිළිබඳ ධානපතියන් පිළිබඳව සාකච්ඡා කර පරිත්‍යාග ලබා ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී. අඩුපාඩු රැසක් සකසා ගන්නා මොහොතක අපෙන් උදව්වක් ඉල්ලා සිටි මෙවැනි මොහොතක ඔවුන්ට සහයෝගයක් ලෙස යම් උපකාරයක් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. එමනිසා සභාවෙන් යම් කාර්යයක් කරන්නට නොහැකි නම් අපේ මේ සිටින මන්ත්‍රී පිරිස සමඟ සාකච්ඡා කර අපි පුද්ගලිකව හෝ එම රෝහලට සහයෝගයක් දැක්වීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මහතා.**

ලලිත් මන්ත්‍රීතුමා ඉතා වැදගත් යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත් පසුගිය කාලයේ මධ්‍යම කඳවුර රෝහල ඉතා ජනප්‍රිය වූ රෝහලක් බවත් ගොඩක් ජනතාව මේ රෝහල පිළිබඳ ඉතා පැහැදීමකින් කතා කරන බවත් අම්පාර රෝහල තරම් තදබදයක් නැති නිසා ඉක්මනින් ප්‍රතිකාර ගත හැකි බව ප්‍රකාශ කරන ලදී. වෛද්‍ය සායන කටයුතු වැනි දේ වැඩි වේගයෙන් සිදුවන බවත් පෙන්වා දෙන ලදී. නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවට මෙය අයිති වුවත් එය ගැටළුවක් කර ගත යුතු නැති බවත් ප්‍රකාශ කරන ලදී. අඩුම තරමේ තෙල් ලීටර 25 කින් හෝ ආධාරයක් කරන්නට හැකි නම් එය ඉතා වැදගත් බව ප්‍රකාශ කරන ලදී. එය ජනතාව වෙනුවෙන් කරන ලද පරිත්‍යාගයක් ලෙස සළකා එය කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු උප සභාපති එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතා.**

ලලිත් මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතා හොඳ බවත් අපේ ප්‍රාදේශීය සභවේ ඉන්ධන බිල ලක්ෂ 12 ක් වැනි මුදලක් වන බවත් එය ගෙවා ගැනීමට නොහැකිව තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. ප්‍රාදේශීය රෝහල් ගත් විට එම රෝහල් වල ප්‍රශ්න ගොඩක් තිබෙන බවත් පසුගිය දිනක ජයවීර මන්ත්‍රීතුමා මා හට දුරකථයෙන් දැනුම් දී සෙනරත්පුර රෝහලේ විවිධ ගැටළු තිබෙන බව ප්‍රකාශ කරන ලදී. ඉන්ධන සභාවෙන් ලබා දීම කිරීමට හැකියාවක් නොමැති තත්ත්වයක් පවතින නිසා මාගේ දීමනාවෙන් රු. 1000.00 ක් ලබා දෙන බවත් එසේ සියලු මන්ත්‍රීතවරුන්ට හැකිනම් රු. 1000.00 බැගින් ලබා දීම සුදුසු බව යෝජනා කරන ලදී. එවිට අපට තෙල් ලීටර 65 ක් පමණ අරගෙන දිය හැකි බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඒ. සුසන්ත කුමාර කුසුම්සිරි මහතා.**

ලලිත් මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව ඉතා වැදගත් යෝජනාවක් බවත් මධ්‍යම කඳවුර රෝහල නාවිදන්වෙලී ප්‍රාදේශීය සභාවට අයත් බල ප්‍රදේශයක පිහිටා තිබුනද උහන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වීරගොඩ ප්‍රදේශය ගත් විට පුස්තකාල වලට සායන මධ්‍යස්ථාන වලට රෝහල් වලට අඩුම ප්‍රතිශතයක මුදල් වෙන්වී ඇති බව පෙන්වා දෙන ලදී. කෙසේ නමුත් අමරකීර්ති මන්ත්‍රීතුමා පමණක් නොව මාත් ඉපදී තිබෙන්නේ මධ්‍යම කඳවුර රෝහලේ බව ප්‍රකාශ කරන ලදී. යුද්ධයට පෙර අම්පාර දිස්ත්‍රික්කයේ උහන බල ප්‍රදේශයවෙඩිම දියුණුම නාගරික ප්‍රදේශය මධ්‍යම කඳවුර ප්‍රදේශය බවත් නමුත් දැන් නොදියුණු බවත් උහනට වැඩිය ගොනාගොල්ලට වඩා ඒ වකවානුවේ දියුණු තත්ත්වයක් මධ්‍යම කඳවුර ප්‍රදේශයේ තිබුන බව පෙන්වා දෙන ලදී. යුද්ධය නිසා එම රෝහල අඩපන වූ බවත් ලලිත් මන්ත්‍රීතුමා කියූ ආකාරයට යළිත් එම රෝහල හොඳ තත්ත්වයකට පත්වී ඇති බව ප්‍රකාශ කරන ලදී. මේ වන විට අම්පාරට යන රෝගීන්ගෙන් 80% ක්ම මධ්‍යමකඳවුර රෝහලින් ප්‍රතිකාර ගන්නා මට්ටමට පැමිණ ඇති බව ප්‍රකාශ කරන ලදී. අප බල ප්‍රදේශයේ ජීවත්වන 80% ක පමණ ජනතාවක් මෙම රෝහල භාවිතා කරන බව පෙන්වා දෙන ලදී. එමනිසා මෙම යෝජනාවට අනුව ලබා දිය හැකි ඉන්ධන ප්‍රමාණය උපරිමයෙන් ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී දර්ශන නුවන් විශ්නදේව මහතා.**

ලලිත් මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතාමත්ම හොඳ එකක් බවත් එහිදී ක්‍රියාව වැදගත් වන බවත් උප සභාපතිතුමාගේ යෝජනාව අනුව දැන් සියලුම මන්ත්‍රීවරුන් ඒකමතිකව ක්‍රියාත්මක වී තමන්ගේ දීමනාවෙන් රු. 1000.00 ක මුදලක් මේ සඳහා ලබා දීමට කැමැත්ත ප්‍රකාශ කිරීම ඉතා හොඳ ආදර්ශයක් බවත් පෙන්වා දෙන ලදී. ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු එකතුවී යම් කිසි හොඳ දෙයක් සිදු කිරීම මේ වේලාවේ ඉතාම වැදගත් බව පෙන්වා දෙන ලදී. උප සභාපතිතුමාගේ යෝජනාව දැන්ම ක්‍රියාත්මක වීම ගැන සියලුම දෙනාට බෙහෙවින් ස්තූතිවන්ත වන බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මහතා.**

ලලිත් මන්ත්‍රීතුමා යෝජනාව ඉදිරිපත් කලේ ප්‍රාදේශීය සභාව මට්ටමින් යම් උපකාරයක් කරන්න පුළුවන් ද කියා බැලීමට බවත් කෙසේ නමුත් එම යෝජනාවට මේ මොහොතේම උපකාර කිරීමට උප සභාපතිතුමා ගත් තීන්දුව ගැන මා පළමුවෙන්ම උහන ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු ලෙස ස්තුතිවන්ත වෙන බව ප්‍රකාශ කරන ලදී. මේ යෝජනාවට අදහස් දැක්වූ සියලුම මන්ත්‍රීවරු පවසා සිටියේ මේ යෝජනාව හොඳ බවත් එයට උදව් කිරීම සුදුසු බවයි. නමුත් මන්ත්‍රීවරු ලෙස අප මේ මොහොතේම ක්‍රියාත්මක වී මේ දේ කරමු යැයි උප සභාපතිතුමා ඍජුවම පවසා සිටි බවත් එසේ එම යෝජනාව මේ මොහොත වන විට ක්‍රියාත්මක වී තිබෙන බවත් එය බොහොම හොඳ ඉතා ගුණාත්මක දෙයක් බවට පත්වී තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. අප බල ප්‍රදේශයේ හිමිදුරාව ප්‍රාදේශීය වෛද්‍ය කාර්යාලයේ කුණු (සිරිනිජර්, ගෝස් කෑලි ආදිය) අප සභාව විසින් ටික දිනක් ගෙන ආ නමුත් දැන් ඒවා අරගැනීමට නොයන බවත් මා බෙහෙත් ලබා ගැනීමට ගිය අවස්ථාවක එහි වෛද්‍යවරයා මා වෙත ඒ බව දන්වා සිටි බවත් එම කුණු ප්‍රතිචක්‍රීකරණය කරන්නට බැරි බව මා සමග පැවසූ බව ප්‍රකාශ කරන ලදී. හිමිදුරාව රෝහලේ වෛද්‍යවරයාත් වීරගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙක් බවද ප්‍රකාශ කරන ලදී. අපට අයත් ප්‍රාදේශීය රෝහල් වල තිබෙන අඩුපාඩු අප විසින් සොයා බලා මන්ත්‍රීවරුන්ගේ සහයෝගයත් අරගෙන උදව් කිරීම සිදුවිය යුතු බවත් ඒ සඳහා ඔබතුමාගේ සහයෝගය ලබා දෙන ලෙසද ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී. සභාවේ මැදිහත්වීම ලබා දීම පුණ්‍යකර්මයක් බවද ප්‍රකාශ කරන ලදී. මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කර කුණු ටික අරගෙන ඒමට කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදී. ලලිත් මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව සියලු මන්ත්‍රීවරු පිළිඅරගෙන සභාවේ උපකාරයක් ලෙස නොව මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික උපකාරයක් ලෙස බල ගැනීවම ගැන සියලු දෙනාටම ස්තුතිවන්ත වන බව ප්‍රකාශ කරන ලදී. මෙවැනි බොහෝ දේ අපට එකතුවී කරන්නට පුළුවන් බවත් මා සිතන බව ප්‍රකාශ කරන ලදී. මෙවැනි ප්‍රශ්න එන්නට කලින් සොයා බලන ලෙසත් හිමිදුරාව ප්‍රාදේශීය රෝහලේ කුණු ප්‍රශ්නය ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ජේ.ආර්. ජගත් ප්‍රසන්න මහතා.**

මේ අවස්ථාවේ පුංචි ඉල්ලීමක් කරන්නට තිබෙන බවත් සෙනරත්පුර රෝහලේ පසුගිය කාලයේ ආලෝකය පිළිබඳ ගැටළුවක් තිබුණ බවත් වෛද්‍යවරුන්ට ඔවුන්ගේ නිල නිවාස වල සිට රෝහලට පැමිණෙන මාර්ගයේ තිබූ විදුලි බුබුළු නැති වී ඇති බැවින් ඒවා ලබා ගැනීමට මාගෙන් ඉල්ලීමක් කළ බවත් මාගේ ළඟ තිබුණු විදුලි බුබුළු 03 ක් ලබා දුන් බවත් තවත් විදුලි බුබුළු 03 ක් පමණ සභාවෙන් ලබා දිය හැකි නම් ඉතා හොඳ බව ප්‍රකාශ කරන ලදී. එය ලබා දෙන ලෙස මා මේ අවස්ථාවේ ඉල්ලීමක් කරන බව ප්‍රකාශ කරන ලදී.

**ගරු උප සභාපති එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතා.**

සෙනරත්පුර රෝහලට අවශ්‍යය විදුලි බුබුළු තුන මා විසින් ලබාදෙන බව ප්‍රකාශ කරන ලදි.

**ගරුසභාපති තුමා.**

ලලිත් කුමාර මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධව මේ ආකාරයට මෙම අවස්ථාවේම ක්‍රියාත්මක වී විසදීම පිළිබඳ සියළුම මන්ත්‍රීවරුන්ට ස්තුති වන්ත වන බවත් , ඔය ආකාරයටම සෙනරත්පුර රෝහලෙන් හා හිමිදුරාව හා ලාතුගල ප්‍රදේශවලින් ඉල්ලීමක් කර ඇති බවත් , එම ප්‍රාදේශීය රෝහල් වල ගැටළුද මේ ආකාරයට යම් උපකාරයක් කිරීමට සියළු දෙනාගේ සහයෝගය බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදි.තවද හෙට දිනයෙන් පසු මැතිවරණ කටයුතු වලට තමන්ගේ රැස්වීම් කිරීම සඳහා ස්ථාන වෙන්කර ගැනීමට හැකියාව ඇති බවත් අපව දැනුවත් කර එසේ රැස්වීම් තිබෙන ස්ථාන වෙන්කර ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.පසුගිය දිනක විමලරත්න මන්ත්‍රීතුමා උහන නගරයේ පොළ භූමිය රැස්වීම් කිරීම සඳහා වෙන්කර ගැනීමට පැමිණි පසු , ලේකම්තුමිය විසින් සභාපතිතුමාගෙන් විමසිය යුතු බව පැවසූ විට ලේකම්තුමියට තර්ජනය කර කියාසිට ඇත්තේ සභාපතිතුමාගෙන් විමසිය යුතු නැති බවත් , ලේකම්තුමියට එම කාර්ය සිදු කල හැකි බවයි.දැන් එම මන්ත්‍රීතුමා මේ සභාවෙන් බැහැර වී ඇති බවත් , එතුමා මාධ්‍යවේදීන් දුටු විට භය වී පිටවී ගොස් ඇති බවත් ප්‍රකාශ කරන ලදි.මා දැනුවත් නොකර එසේ මුදල් ලබා ගත්තේ කෙසේදැයි මා විසින් ලේකම්තුමියගෙන් විමසූ බවත් ,මා තවම සභාපති බවත් , තවම ධූරයෙන් විසුරුවා නැති බවත් , මා සිටින තුරු රැස්වීම් තැබීමට මාගෙන් විමසීමක් නොකර භූමිය කුලියට නොදෙන ලෙස

ලේකම්තුමිය දැනුවත් කල බවත් ප්‍රකාශ කරන ලදි.සියළුදෙනාටම අප සහයෝගය ලබා දිය යුතු බවත් ,නමුත් පොදු වෙළඳ සංකීර්ණයක් තිබෙන තැනක එතන කඩ පේලියක් තිබෙන බවත් , ඒ අය මාසික කුලියක් අපට ගෙවන බව අප මතක තබා ගත යුතු බවත් පැහැදිලි කරන ලදි.එම නිසා අප මේ පිලිබඳ පිළිවෙලට වැඩකල යුතු බව පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

උහන පොදු වෙළඳ සංකීර්ණය රැස්වීම් තියන්නට කුලියට නොදෙන ලෙස ප්‍රකාශ කරන ලදි.නිවාස 30 ක්‍රීඩාංගනය ඒ සඳහා ලබාදිය හැකි බව පෙන්වා දෙන ලදි. අද දින සභා තීන්දුවක් ගෙන පොදු වෙළඳ සංකීර්ණය රැස්වීම් තැබීම සඳහා කුලියට නොදිය යුතු බව සම්මත කර ගත යුතු බව ප්‍රකාශ කරන ලදි.දැන් එම ස්ථානයේ ඇති කඩ ටික කඩා හදන නිසා අමුද්‍රව්‍ය තබා ගැනීම සඳහා ඉඩකඩ තිබිය යුතු බැවින් රැස්වීම් කිරීමට එම ස්ථානය නොදීම සුදුසු බව පෙන්වා දෙන ලදි.

**ගරුසභාපති තුමා.**

ලේකම් තුමිය බිලක් කඩා මුදල් ලබාගෙන ඇති නිසා දැන් කිසිවක් කල නොහැකි බවත් , නමුත් තර්ජනය කරන්නට ඔහුට හැකියාවක් නොමැති බවත් ප්‍රකාශ කරන ලදි.මම ලොක්කෙක් ආදී ලෙස පාට් දමන්නට ඔහුට නොහැකි බවත් , විමලරත්න මන්ත්‍රීතුමාගේ ආණ්ඩුවක් යටතේ , ඔවුන්ගේ සභාපතිවරයෙක් යටතේ ඔවුන්ට ඕන දෙයක් කරන්නට හැකි බවත් , මේවා අහගෙන ඉන්න බැරි නිසා සභාවෙන් බැහැර ගොස් ඇති බවත් ප්‍රකාශ කරන ලදි. මාධ්‍යවේදීන් දුටුවිට පැනලා දුවනවානම් අභියෝග භාර ගන්න ඔවුන් බැරි කොටසක් බවද පෙන්වා දෙන ලදි.කවුරු රැස්වීම් තියන්න භූමිය වෙන්කර ගැනීමට පැමිණියද අප සමග කතාකර එය වෙන්කර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු උප සභාපති එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතා.**

රංජිත් මන්ත්‍රීතුමා පවසා සිටින්නේ සභාවෙන් පොදු තීන්දුවක් ගතයුතු බව නම් එය එසේ කරන ලෙසත් , පොදු වේ සියළුම දෙනාටම මෙම පොළ භූමිය රැස්වීම් සඳහා ලබා නොදී සිටීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**ගරුසභාපති තුමා.**

දැන් මුදල් බැද එය වෙන්කර ඇති බැවින් එසේ තහනම් කරන්නට බැරිබව ප්‍රකාශ කරන ලදි.නමුත් මම ඔහුට අභියෝග කරන බවත් පුළුවන්නම් දිනලා ඇවිත් සභාව පිහිටුවලා පෙන්වන ලෙසයි. එතුමාට එතුමාගේ කොට්ඨාශයවත් දිනලා එන්න බැරිවෙන බව ප්‍රකාශ කරන ලදි.මම පරද්දවන්න කිසිම කෙනෙකුට බැරි බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මහතා.**

ප්‍රාදේශිය සභාවේ භූමිය වෙන්කර ගැනීමට සියළුම දෙනාට අවසර තිබුනත් ලේකම්තුමියට හා නිළධාරී මණ්ඩලයට පාට් දැමීමට ඔවුන්ට හැකියාවක් නැති බවත් , මා එය හෙලා දකින බවත් ප්‍රකාශ කරන ලදි.ඡන්දයේදී කාටවත් බලපෑම් කරන්නට හැකියාවක් නැති බවත් පෙන්වා දෙන ලදි. ඔවුන් ඔවුන්ගේ පසුගිය භීෂණය නැවත ගෙන එන්නට හදන බවත් , තිස්සපුර කොට්ඨාශයේ වැදගත් මහත්මයකුට එළියට බැස්සොත් කණට ගසනවායැයි පවසා ඇති බවත් , තව අපේ හිතවත් මහත්මයකුගේ ගෙදර ඩෝසර් කරනවා යැයි පවසා ඇති බවත් , ඒ ආකාරයේ දෙකේ පන්තියේ දේශපාලන ක්‍රමයක් ඉදිරියට ගෙනයන බව පෙන්වා දෙන ලදි.මම ඊයේ මළ ගෙදරක යන්න හදනවිට එන්න එපා ගහන්න ඉන්න බව මට ආරංචි වූ බවත් , අපි මළගෙදර යන එක නවත්තන්න හදන බවත් , 89 වර්ෂයේ අපි දේශපාලනය කරා නම් අද දේශපාලනය කරන්න භය නැති බවත් පෙන්වා දෙන ලදි.අද එතුමා මෙතන හිටියානම් වටින බව ප්‍රකාශ කරන ලදි.සභාවට මුහුණ දෙන්න බැරිව කී පාරක් පැනලා ගියාදැයි විමසන ලදි.සභාව නියෝජනය කරන්නේ නැතිව ගම ගැන හිතන්නේ කෙසේදැයි විමසන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මහතා.**

උහන පොදු වෙළඳ සංකීර්ණය කුලියට දීම ගැන සාකච්ඡා වූ බවත් , උහන පොදු වෙළඳ සංකීර්ණය කුලියට දීම සඳහා බිල්පතක් නිකුත් කර මුදල් ලබාගෙන තිබෙන එක අවලංගු කිරීමට හැකියාව ඇත්නම් එසේ කරන ලෙසත් එක් අයෙකුට හෝ එය ලබා දුන්නොත් අපටත් එය ලබා දිය යුතු බව ප්‍රකාශ කරන ලදි පුළුවන්නම් සභා තීන්දුවක් අරගෙන කාටවත් දෙන්නේ නැතිව සිටීම සිදුවිය යුතු බව ප්‍රකාශ කරන ලදි.

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යෝජනාව ඒකමතිකව සම්මත විය.**

## 07. කාරක සභාවල වාර්තා - නැත

## 08.2023 ජනවාරි මස ආදායම් වියදම් වාර්තාව ඉදිරිපත් කිරීම

ආදායම් විග්‍රහය -2023 ජනවාරි

| | | | | |
|---|---|---|---|---|
| 01. පොදු පරිපාලන | වරිපනම් | රු: | 292,542.36 | |
| | ව්‍යාපාර බදු | රු: | 63,600.00 | |
| | බයිසිකල් | රු: | | |
| | විවිරේබා සහතික | රු: | | |
| | වරිපනම් දඩ | රු: | | |
| | වරිපනම් දඩ/උසාවි දඩ | රු: | | |
| | පෝරම ගාස්තු | රු: | 2,790.00 | |
| | අභ්‍යන්තර බිල්කිරීම් | රු: | 1,200.00 | |
| | සේවක ණය පොළි | රු: | 8,571.44 | |
| | වැටුප් ප්‍රතිපූරණය | රු: | 2,163,231.48 | |
| | **එකතුව** | රු: | | **2,531,935.28** |
| 02.සෞඛ්‍ය සේවා | වෙළඳ බලපත්‍ර | රු: | 12,000.00 | |
| | පරිසර බලපත්‍ර | රු: | | |
| | පරිසර බලපත්‍ර පරීක්ෂාව | රු: | | |
| | සුනඛ එන්නත් | රු: | | |
| | වැටුප් ප්‍රතිපූරණය | රු: | 345,130.00 | |
| | **එකතුව** | රු: | | **357,130.00** |
| 03.භෞතික සැලසුම් | ගෙවල් කුලි | රු: | | |
| | කුලියට දීම (වාහන) | රු: | 32,000.00 | |
| | කුලියට දීම් (භූමිය) | රු: | 6,500.00 | |
| | දීර්ඝ කාලීන බලපත්‍ර | රු: | | |
| | ගොඩනැගිලි පරීක්ෂාව | රු: | 17,500.00 | |
| | සැලසුම් ශිල්පීන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | රු: | | |
| | අයකර ගතහැකි ගාස්තු | රු: | | |
| | වැටුප් ප්‍රතිපූරණය | රු: | 395,355.48 | |
| | **එකතුව** | රු: | | **451,355.48** |
| 04.ජල සේවා | ජල බවුසරය | රු: | | |
| | නල ළිං | රු: | | |
| | **එකතුව** | රු: | | - |
| 05.උපයෝගී සේවා | කඩකාමර කුලි (උහන, වැරැන්කැටගොඩ) | රු: | 82,431.34 | |
| | මස්කඩ | රු: | | |
| | පොල බදු | රු: | 105,780.00 | |
| | අයකර ගතහැකි ගාස්තු | රු: | | |
| | පොළ/කඩකාමර ප්‍රමාද ගාස්තු | රු: | 2,087.16 | |
| | **එකතුව** | රු: | | **190,298.50** |
| 06.සුභසාධන සේවා | විනෝද බදු | රු: | | |
| | ප්‍රචාරක දැන්වීම් පුවරු | රු: | | |
| | ගවයන් ඇල්ලීම | රු: | | |
| | පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු | රු: | 120.00 | |
| | වැටුප් ප්‍රතිපූරණය | රු: | 133,770.00 | |
| | **එකතුව** | රු: | | **133,890.00** |
| 07.විදුලිය | වැටුප් ප්‍රතිපූරණය | රු: | 6,000,000.00 | |
| | **එකතුව** | රු: | | **6,000,000.00** |
| | පුනරාවර්තන ආදායම් එකතුව | | | **9,664,609.26** |
| | ප්‍රාග්ධන ආධාර | | | - |
| | **එකතුව** | | | **9,664,609.26** |

42

| | | | | |
|---|---|---|---|---|
| වෙනත් ලැබීම් | පුස්තකාල තැන්පත් | රු: | 3,310.00 | |
| | සේවක ණය | රු: | 37,250.00 | |
| | විවිධ තැන්පත් | රු: | | |
| | ටෙන්ඩර් තැන්පත් | රු: | | |
| | මුද්දර තැන්පත් | රු: | 1,350.00 | |
| | වැටුප් තැම්පත් | රු: | | |
| | අත්තිකාරම් පියවීම | රු: | 606.13 | |
| | මුදල් මාරු | රු: | 700,000.00 | |
| | ණය ගැති | රු: | | |
| | එකතුව | රු: | | 742,516.13 |
| | මුළු එකතුව | | | 10,407,125.39 |

සකස් කලේ :-

පරීක්ෂා කලේ:-

ලේකම්
ප්‍රාදේශීය සභාව,
උහන.

**එම්.ඒ.පී. මැදගොඩ**
**ලේකම්**
**ප්‍රාදේශීය සභාව**
**උහන**

## උහන ප්‍රාදේශීය සභාවේ මාසික ඒකාබද්ධ වැය සාරාංශය
## 2023 ජනවාරි මාසය

| | | | |
|---|---|---|---|
| 1 | අතිකාල ගෙවීම | | |
| | 01. ඩී.එම්. තිස්ස කුමාර මයා (2022 දෙසැම්බර් මස පැය 20 ක් සඳහා) | 2,566.60 | 01/04 |
| 2 | 01. ඒ.පී.ප්‍රදීප් පත්මචන්ද්‍ර මයා (2022 දෙසැම්බර් මස දෛනික වැටුප් ගෙවීම) | 23,154.41 | 01/02 |
| | 02. ටී.පී.ඩී. හේමමාලි රණවීර මිය (2022 දෙසැම්බර් මස දෛනික වැටුප් ගෙවීම) | 17,752.00 | |
| | 03. එච්.එම්. ප්‍රදීප් සඳකැලුම් මයා (2022 දෙසැම්බර් මස දෛනික වැටුප් ගෙවීම) | 31,173.41 | |
| | 04. ඩී.එම්. දිලාන් තනුජ මයා (2022 දෙසැම්බර් මස දෛනික වැටුප් ගෙවීම) | 24,255.64 | |
| | 05. ඒ.ආර්.ඩී.පී.සී. බණ්ඩාර මයා (2022 දෙසැම්බර් මස දෛනික වැටුප් ගෙවීම) | 34,589.21 | |
| | 06. සේවක අර්ථසාධක අරමුදල (දෛනික වැටුප් අවකරණ) | 30,578.58 | |
| | 07. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (දෛනික වැටුප් අවකරණ) | 4,586.77 | |
| | 08. ප්‍රාදේශීය සභා සුභ සාධක සංගමය (දෛනික වැටුප් අවකරණ) | 3,362.50 | |
| 3 | මධ්‍යම පරිසර අධිකාරිය, දිස්ත්‍රික් කාර්යාලය,අම්පාර (වාහන සේවා මධ්‍යස්ථානය ඉදි කිරීමට අදාල පරිසර බලපත්‍ර නිර්දේශ කිරීමේ ගාස්තුව ගෙවීම) | 5,000.00 | 01/01 |
| 4 | නිව් ප්‍රියංක මෝටර්ස් අම්පාර (ආයතනයට අයත් PE-8373 කැබ් රථයේ ගැස්කට් යොදා අලුත්වැඩියා කිරීමේ ගාස්තු ගෙවීම) ප්‍ර.ක.දි. 2023.01.10 | 238,450.00 | 01/03 |
| 5 | ලේකම් ප්‍රාදේශීය සභාව උහන (2023 වර්ෂය සඳහා සුළු මුදල් ලබා ගැනීම) | 5,000.00 | 01/05 |
| 6 | පුබුදු එන්ටර්ප්‍රයිසස් (ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම) ප්‍ර.ක.දි. 2022.06.22 | 147,500.00 | 01/06 |
| 7 | එච්.එම්.ඩබ්. බණ්ඩාර මයා දමිත් ලංකා ඉන්ධන පිරවුම්හල (ආයතනයට අයත් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය සඳහා ලබා ගත් ඉන්ධන බිල්පත් නිරවුල් කිරීම) | 107,500.00 | 01/07 |
| 8 | එච්.එම්.ඩබ්. බණ්ඩාර මයා දමිත් ලංකා ඉන්ධන පිරවුම්හල (2022.12.11-2022.12.20 දක්වා ලබා ගත් ඉන්ධන බිල්පත් නිරවුල් කිරීම) | 197,190.00 | 01/08 |
| 9 | එච්.එම්.ඩබ්. බණ්ඩාර මයා දමිත් ලංකා ඉන්ධන පිරවුම්හල (2022.12.01-2022.12.10 දක්වා ලබා ගත් ඉන්ධන බිල්පත් නිරවුල් කිරීම) | 190,580.00 | 01/09 |
| 10 | පුබුදු එන්ටර්ප්‍රයිසස් (ටෝනර් මිලදී ගැනීම) ප්‍ර.ක.දි. 2022.06.22 | 10,950.00 | 01/10 |
| 11 | පුබුදු එන්ටර්ප්‍රයිසස් (වැරැන්කැටගොඩ වෙළඳ සංකීර්ණය සඳහා ප්‍රථමාධාර පෙට්ටියක් හා ඉදල් මිලදී ගැනීම) | 4,750.00 | 01/11 |
| 12 | සියනෑ බිල්ඩින් මෙටීරියල් සෙන්ටර් (ජල බවුසරය සඳහා අවශ්‍ය උපාංග මිලදී ගැනීම) | 2,188.00 | 01/12 |
| 13 | ලේකම් ප්‍රාදේශීය සභාව උහන (EP UC 6612 යතුරුපැදියේ ආදායම් බලපත්‍ර ගාස්තු, දුම්පරීක්ෂා කිරීමේ ගාස්තු,රක්ෂණාවරණ ගාස්තු ගෙවීම සඳහා අත්තිකාරම් මුදල් ඉල්ලීම) | 6,500.00 | 01/13 |
| 14 | ලේකම්, ප්‍රාදේශීය සභාව, උහන (ලියාපදිංචි තැපැල සඳහා මුද්දර ලබා ගැනීම) | 2,500.00 | .01/14 |
| 15 | ලේකම්, ප්‍රාදේශීය සභාව, උහන (සුළු මුදල් ලබා ගැනීම) | 4,803.00 | 01/15 |

| | | | |
|---|---|---|---|
| 16 | කීර්ති පොත් හල හා කොමියුනිකේෂන් උහන (ලේකම්තනතුර සඳහා රබර් සීල් එකක් කැපීම) | 1,500.00 | ;01/16 |
| 17 | සභාපති, M-5-2 ගොවි සංවිධානය,රජගම,වීරගොඩ (ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2021 යටතේ මාර්ග කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් සමිතිය වෙත ලබා දෙන මුදලින් කොටසක් ගෙවීම) | 500,000.00 | W/01/10 |
| 18 | සභාපති,LB 15 බෙදුම් ඇල ගොවි සංවිධානය,ගලහිටියාගොඩ (ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2021 යටතේ මාර්ග කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් සමිතිය වෙත ලබා දෙන මුදලින් කොටසක් ගෙවීම) | 500,000.00 | W/01/09 |
| 19 | සභාපති,M1බෙදුම් ඇල ගොවි සංවිධානය ,වීරගොඩ වඩයන්තලාව (ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2021 යටතේ මාර්ග කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් සමිතිය වෙත ලබා දෙන මුදලින් කොටසක් ගෙවීම) | 500,000.00 | W/01/08 |
| 20 | සභාපති,MS 5 බෙදුම් ඇල ගොවි සංවිධානය ,බුද්ධංගල ගොවිපළ දඩයම්තලාව(ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2021 යටතේ මාර්ග කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් සමිතිය වෙත ලබා දෙන මුදලින් කොටසක් ගෙවීම) | 700,000.00 | W/01/07 |
| 21 | සභාපති,UB 3,4,5,6 බෙදුම් ඇල ගොවි සංවිධානය ,දෙමටමල්පැලැස්ස (ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2021 යටතේ මාර්ග කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් සමිතිය වෙත ලබා දෙන මුදලින් කොටසක් ගෙවීම) | 1,060,000.00 | W/01/06 |
| 22 | සභාපති,LB 16 වළගම්බා බෙදුම් ඇල ගොවි සංවිධානය, (ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2021 යටතේ මාර්ග කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් සමිතිය වෙත ලබා දෙන මුදලින් කොටසක් ගෙවීම) | 500,000.00 | 'W/01/05 |
| 23 | LA Weera SA And SO වැරැන්කැටගොඩ (ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2021 යටතේ මාර්ග කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් සමිතිය වෙත ලබා දෙන මුදලින් කොටසක් ගෙවීම) | 800,000.00 | W/01/04 |
| 24 | සභාපති,34/35/36 ගොවි සංවිධනය රජගලතැන්න (ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2021 යටතේ මාර්ග කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් සමිතිය වෙත ලබා දෙන මුදලින් කොටසක් ගෙවීම) | 500,000.00 | W/01/03 |
| 25 | සභාපති,G 4/7 බෙදුම් ඇල ගොවි සංවිධනය මායාදුන්න (ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2021 යටතේ මාර්ග කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් සමිතිය වෙත ලබා දෙන මුදලින් කොටසක් ගෙවීම) | 440,000.00 | W/01/02 |
| 26 | සභාපති,G 4/7 බෙදුම් ඇල ගොවි සංවිධනය මායාදුන්න (ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2021 යටතේ මාර්ග කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් සමිතිය වෙත ලබා දෙන මුදලින් කොටසක් ගෙවීම) | 500,000.00 | W/01/01 |
| 27 | එම්.ඩී.කේ.ඩබ්. ගුණතිලක මයා ප්‍රාදේශිය සභාව උහන (ආපදා ණය ලබා දීම) | 50,000.00 | S/01/02 |
| 28 | ලේකම් ප්‍රාදේශිය සභාව උහන (මුදල් මාරු) | 700,000.00 | S/01/03 |
| 29 | ස්ථිර වැටුප් (ජනවාරි මස) | 2,410,182.58 | |
| 30 | මන්ත්‍රී දීමනා (ජනවාරි මස) | 480,000.00 | |
| | එකතුව | 10,736,612.70 | |
| | **හරස් සටහන්** | 52,250.95 | |
| | **මුළු එකතුව** | **10,788,863.65** | |

සකස් කළේ :- Sanya.

පරීක්ෂා කළේ :-

ලේකම්,
ප්‍රාදේශිය සභාව,
උහන.

එම්.ඒ.ප. මැදගොඩ
ලේකම්
ප්‍රාදේශිය සභාව
උහන

**2023 ජනවාරි මස ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තාව මහ සභාවේදී සම්මත විය.**

2022 දෙසැම්බර් මස ධාවන සටහන් විස්තරය PE-8373 කැබ් රථය

| දිනය | සිදු කළ කාර්යය | ලබා ගත් ඉන්ධන ප්‍රමාණය | පසු ගිය මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | ධාවනය කළ කි.මී. පැ.මී. |
|---|---|---|---|---|
| | | | 20L | |
| 2022.12.01 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු ගොනාගොල්ල නුගේලන්ද නැවත ප්‍රා.ස. ආපසු අම්පාර අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.12.02 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු උහන අවට ආපසු සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. වෙත | | | 16 |
| 2022.12.03 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු අම්පාර සහ ඒ අවට ආපසු නුගේලන්ද පියංගල හරහා ප්‍රා.ස. ආපසු මහකණ්ඩිය ආපසු ප්‍රා.ස. නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | 72 | | 72 |
| 2022.12.04 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ගොනාගොල්ල නවගිරියාව සහ ඒ අවට ආපසු ප්‍රා.ස. නැවත උහන අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. වෙත | | | 64 |
| 2022.12.05 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු උහන නගරය අවට ආපසු අම්පාර ගරය අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.12.06 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු හිඹිදුරාව නැවත උහන නගරය අවට ආපසු රජගලතැන්න ආපසු ප්‍රා.ස. දක්වා ආපසු සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. වෙත | | | 64 |
| 2022.12.07 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස ආපසු උහන නගරය ආපසු රජගලතැන්න නැවත අම්පාර සහ ඒ අවට නැවත උහන නගරය අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.12.08 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු සේනාගම අවට නැවත ප්‍රා.ස. ආපසු උහන නගරය අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 40 |
| 2022.12.09 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු අම්පාර සහ ඒ අවට නැවත ප්‍රා.ස. ආපසු උහන අවට ආපසු කුමාරිගම නැවත ප්‍රා.ස. ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 48 |
| 2022.12.10 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. නැවත අම්පාර සහ ඒ අවට ආපසු ප්‍රා.ස. ආපසු ගොනාගොල්ල නවගිරියාව නැවත ප්‍රා.ස. දක්වා ආපසු අම්පාර සහ ඒ අවට නැවත ප්‍රා.ස. ආපසු හිඹිදුරාව නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |

| | | | | |
|---|---|---|---|---|
| 2022.12.11 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු උහන නගරය අවට නැවත අම්පාර සහ ඒ අවට ආපසු ප්‍රා.ස. දක්වා නැවත සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. වෙත | | | 48 |
| 2022.12.12 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු අම්පාර සහ ඒ අවට නැවත ගොනාගොල්ල ආපසු සේනාගම නැවත ප්‍රා.ස. දක්වා ආපසු කුමාරිගම නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | 60 | | 56 |
| 2022.12.13 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු උහන අවට නැවත සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. වෙත | | | 16 |
| 2022.12.14 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු අම්පාර සහ ඒ අවට නැවත වළගම්පුර ආපසු ප්‍රා.ස. දක්වා නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 48 |
| 2022.12.15 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු අම්පාර සහ ඒ අවට නැවත උහන අවට ආපසු ගලහිටියාගොඩ නැවත ප්‍රා.ස. ආපසු වැරැන්කැටගොඩ නැවත සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.12.16 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු සුහදගම නැවත ප්‍රා.ස. ආපසු උහන අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 48 |
| 2022.12.17 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු රජගලතැන්න නැවත ප්‍රා.ස. ආපසු උහන අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 40 |
| 2022.12.18 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු අම්පාර සහ ඒ අවට නැවත උහන හා ඒ අවට ආපසු ගොනාගොල්ල ආපසු ප්‍රා.ස. නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.12.19 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු අම්පාර සහ ඒ අවට නැවත නුගේලන්ද ආපසු ප්‍රා.ස. දක්වා නැවත වළගම්පුර ආපසු උහන නගරය හා ඒ අවට නැවත කල්මුණේ ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා | 54 | | 112 |
| 2022.12.20 | සභාපතිතුමාගේ නිවස සිට කොළඹ අගමැති කාර්යාලය දක්වා ආපසු කඩවත නවාතැන්පල දක්වා | | | 340 |
| 2022.12.21 | කඩවත නවාතැන්පල සිට මහාමාර්ග අමාත්‍යංශය දක්වා නැවත කඩවත ගරාජය දක්වා | 25 | | 32 |
| 2022.12.22 | ගරාජයේ සිට අම්පාර උහන ප්‍රා.ස. දක්වා ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 328 |

| | | | | |
|---|---|---|---|---|
| 2022.12.25 | ප්‍රා.ස. සිට අම්පාර ගරාජය දක්වා | | | 12 |
| | මේ මස ලබා ගත් ඉන්ධන | 211 L | | |
| | මුළු ඉන්ධන ප්‍රමාණය | | 231 L | |
| | වැය වූ ඉන්ධන ප්‍රමාණය හා ධාවනයේ යෙදී ඇති කි.මී. ගණන (ඉන්ධන ලිටර් 01 කින් කි.මී. 08 ක් ධාවනය කළ හැකිය. මෙම මස කි.මී. 1720 ක් ධාවනයේ යෙදී ඇත) | | 215 L | 1720 Km |
| | මෙම මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | | 16 L | |

ලේකම්,
ප්‍රාදේශිය සභාව,
උහන.

එම්.ජී.පී. මැදගොඩ
ලේකම්
ප්‍රාදේශිය සභාව
උහන

**2023 ජනවාරි මස ධාවන සටහන් විස්තරය PE-8373 කැබ් රථය**

| දිනය | සිදු කළ කාර්යය | ලබා ගත් ඉන්ධන ප්‍රමාණය | පසු ගිය මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | ධාවනය කළ කි.මී. පැ.මී. |
|---|---|---|---|---|
| | | | 16 L | |
| 2023.01.11 | අම්පාර ගරාජයේ සිට ප්‍රා.ස. වෙත | 60 | | 12 |
| 2023.01.12 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු අම්පාර සහ ඒ අවට නැවත ගොනාගොල්ල රජගලතැන්න ආපසු උහන නගරය අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 64 |
| 2023.01.13 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු උදයගිරිය අවට නැවත කුමාරිගම ආපසු ප්‍රා.ස. දක්වා නැවත අම්පාර නගරය ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 48 |
| 2023.01.14 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු අම්පාර සහ ඒ අවට නැවත උහන හා ඒ අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 48 |
| 2023.01.15 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු ගොනාගොල්ල නුගේලන්ද නැවත ප්‍රා.ස. දක්වා ආපසු කුමාරිගම නැවත ප්‍රා.ස. දක්වා ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 64 |
| 2023.01.16 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු අම්පාර සහ ඒ අවට ආපසු උහන අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 40 |
| 2023.01.17 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු මධ්‍යම කඳවුර නැවත ප්‍රා.ස. දක්වා ආපසු අම්පාර සහ ඒ අවට නැවත ප්‍රා.ස. දක්වා ආපසු උහන අවට නැවත සාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 64 |
| 2023.01.18 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු අම්පාර සහ ඒ අවට නැවත ප්‍රා.ස. දක්වා ආපසු රුහුණුගම ආපසු ප්‍රා.ස. දක්වා නැවත සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. වෙත | | | 64 |
| 2023.01.19 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු අම්පාර හා ඒ අවට නැවත උහන අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 40 |
| 2023.01.20 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු උහන අවට නැවත අම්පාර සහ ඒ අවට ආපසු ප්‍රා.ස. දක්වා නැවත ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. වෙත | | | 56 |
| 2023.01.21 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු සේනාගම සහ ඒ අවට නැවත උහන නගරය අවට ආපසු අම්පාර නැවත ප්‍රා.ස. දක්වා නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |

| | | | | |
|---|---|---|---|---|
| 2023.01.22 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු උහන අවට නැවත අම්පාර සහ ඒ අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 32 |
| 2023.01.23 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. දක්වා ආපසු අම්පාර සහ ඒ අවට නැවත උහන අවට නැවත වලගම්පුර නැවත ප්‍රා.ස. දක්වා ආපසු සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. දක්වා | 60 | | 56 |
| 2023.01.24 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු ගොනාගොල්ල නුගේලන්ද නැවත ප්‍රා.ස. ආපසු උහන අවට නැවත ප්‍රා.ස. ආපසු සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. වෙත | | | 48 |
| 2023.01.25 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු උහන අවට නැවත සභාපතිතුමාගේ නිවස ආපසු ප්‍රා.ස. වෙත | | | 16 |
| 2023.01.26 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. නැවත අම්පාර සහ ඒ අවට ආපසු උහන අවට නැවත කුමාරිගම ආපසු ප්‍රා.ස. දක්වා නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |
| 2023.01.27 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු උහන අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 16 |
| 2023.01.28 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත අම්පාර සහ ඒ අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ප්‍රා.ස. වෙත | | | 40 |
| 2023.01.29 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. නැවත අම්පාර සහ ඒ අවට ආපසු උහන හා ඒ අවට ආපසු සභාපතිතුමාගේ නිවස වෙත | | | 56 |
| 2023.01.30 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. ආපසු අම්පාර සහ ඒ අවට නැවත උහන අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 48 |
| 2023.01.31 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු අම්පාර සහ ඒ අවට ආපසු උහන අවට ආපසු මායාදුන්න ආපසු ප්‍රා.ස. දක්වා නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |
| | මේ මස ලබා ගත් ඉන්ධන | **120 L** | | |
| | මුළු ඉන්ධන ප්‍රමාණය | | **136 L** | |
| | වැය වූ ඉන්ධන ප්‍රමාණය හා ධාවනයේ යෙදී ඇති කි.මී. ගණන (ඉන්ධන ලීටර් 01 කින් කි.මී. 08 ක් ධාවනය කළ හැකිය. මෙම මස කි.මී. 980 ක් ධාවනයේ යෙදී ඇත) | | **122.5 L** | **980 Km** |
| | මෙම මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | | **13.5 L** | |

ලේකම්,
ප්‍රාදේශීය සභාව,
උහන.
එම්.ජී.පී. මැදගොඩ
ලේකම්

## 2023 ජනවාරි මස ධාවන සටහන් විස්තරය LL - 7523 කැබ් රථය

| දිනය | සිදු කළ කාර්යය | ලබා ගත් ඉන්ධන ප්‍රමාණය | පසු ගිය මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | ධාවනය කළ කි.මී. පැ.මී. |
|---|---|---|---|---|
| | | | 25 L | |
| 2023.01.02 | ප්‍රා.ස. සිට උදයගිරිය අවට විථි ලාම්පු නඩත්තු කිරීම හා කුමාරිගම විථි ලාම්පු නඩත්තු කර ප්‍රා.ස. වෙත | | | 21 |
| 2023.01.03 | ප්‍රා.ස. සිට උදයගිරිය අවට විථි ලාම්පු නඩත්තු කිරීමට ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 14 |
| 2023.01.04 | ප්‍රා.ස. සිට වළගම්පුර අවට විථි ලාම්පු නඩත්තු කර ආපසු ප්‍රා.ස. වෙත | | | 35 |
| 2023.01.08 | ප්‍රා.ස. සිට අම්පාර සහ ඒ අවට ආපසු උහන අවට ආපසු ප්‍රා.ස. වෙත | | | 35 |
| 2023.01.09 | ප්‍රා.ස. සිට ගලහිටියාගොඩ සහ දෙමටමල්පැලැස්ස අවට විථි ලාම්පු නඩත්තු කර ආපසු ප්‍රා.ස. වෙත | 70 | | 35 |
| 2023.01.10 | ප්‍රා.ස. සිට නාමල්ඔය ප්‍රාදේශීය සභාව වෙත ගොස් ආපසු ප්‍රා.ස. ආපසු අම්පාර පුබුදු ආයතනය වෙත හා අම්පාර අවට ආපසු ප්‍රා.ස. වෙත | | | 77 |
| 2023.01.11 | ප්‍රා.ස. සිට වළගම්පුර ගොස් ආපසු ප්‍රා.ස. වෙත නැවත දෙමටමල්පැලැස්ස, උදයගිරිය විථි ලාම්පු නඩත්තු කර ආපසු ප්‍රා.ස. වෙත | | | 35 |
| 2023.01.13 | ප්‍රා.ස. සිට කුමාරිගම වෙත විථි ලාම්පු නඩත්තු කිරීමට ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 21 |
| 2023.01.16 | ප්‍රා.ස. සිට කොහොඹාන, උදයගිරිය, දෙමටමල්පැලැස්ස, වැලිකහගොල්ල යන ස්ථාන වල විථි ලාම්පු නඩත්තු කර ආපසු ප්‍රා.ස. වෙත | | | 35 |
| 2023.01.17 | ප්‍රා.ස. සිට කහටගස්යාය, මහකණ්ඩිය යන ස්ථානවල විථි ලාම්පු නඩත්තු කර ආපසු ප්‍රා.ස. වෙත | | | 28 |
| 2023.01.18 | ප්‍රා.ස. සිට සමනබැද්ද, දෙමටමල්පැලැස්ස යන ස්ථාන වල විථි ලාම්පු නඩත්තු කර ආපසු ප්‍රා.ස. වෙත | | | 14 |
| 2023.01.19 | ප්‍රා.ස. සිට හිම්දුරාව වෙත ගොස් විථි ලාම්පු නඩත්තු කර ආපසු ප්‍රා.ස. වෙත | | | 35 |
| 2023.01.20 | ප්‍රා.ස. සිට දෙමටමල්පැලැස්ස, ගලහිටියාගොඩ විථි ලාම්පු නඩත්තු කිරීමට ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 28 |
| 2023.01.23 | ප්‍රා.ස. සිට ගලපිටගල වෙත ගොස් ආපසු ප්‍රා.ස. ඉන්පසු දෙමටමල්පැලැස්ස වැලිකහගොල්ල විථි ලාම්පු නඩත්තු කිරීමට ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |
| 2023.01.24 | ප්‍රා.ස. සිට ගලපිටගල වෙත ගොස් ඒ අවට විථි ලාම්පු නඩත්තු කර ආපසු ප්‍රා.ස. වෙත | | | 35 |

| | | | | |
|---|---|---|---|---|
| 2023.01.25 | ප්‍රා.ස. සිට අම්පාර පුබුදු ආයතනය වෙත ගොස් ආපසු ප්‍රා.ස. ඉන්පසුව තිස්සපුර අවට විථි ලාම්පු නඩත්තු කිරීමට ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |
| 2023.01.26 | ප්‍රා.ස. සිට දෙමටමල්පැලැස්ස සහ උහන අවට විථි ලාම්පු නඩත්තුව සඳහා ගොස් නැවත ප්‍රා.ස. වෙත | 60 | | 21 |
| 2023.01.29 | ප්‍රා.ස. සිට දෙමටමල්පැලැස්ස සහ උහන අවට විථි ලාම්පු නඩත්තුව සඳහා ගොස් නැවත ප්‍රා.ස. වෙත | | | 21 |
| 2023.01.30 | ප්‍රා.ස. සිට රජගලතැන්න වෙත ගොස් ඒ අවට විථි ලාම්පු නඩත්තු කර ඉන්පසු ප්‍රා.ස. වෙත | | | 42 |
| 2023.01.31 | ප්‍රා.ස. සිට ගලපිටගල වෙත ගොස් එහි අවට විථි ලාම්පු නඩත්තු කර නැවත ප්‍රා.ස. වෙත | | | 35 |
| | මේ මස ලබා ගත් ඉන්ධන | **130 L** | | |
| | මුළු ඉන්ධන ප්‍රමාණය | | **155 L** | |
| | වැය වූ ඉන්ධන ප්‍රමාණය හා ධාවනයේ යෙදී ඇති පැ.මී. ගණන (ඉන්ධන ලීටර් 01 කින් කි.මී. 07 ක් ධාවනය කළ හැකිය. මෙම මස කි.මී. 651 ක් ධාවනයේ යෙදී ඇත) | | **93 L** | **651 Km** |
| | මෙම මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | | **62 L** | |

ලේකම්,
ප්‍රාදේශිය සභාව,
උහන.

එම්.ජී.පී. මැ[illegible]
ලේකම්
ප්‍රාදේශිය සභාව
උහන

**2023 ජනවාරි මස ධාවන සටහන් විස්තරය ZB-0351 කම්පැක්ටර් රථය**

| දිනය | සිදු කළ කාර්යය | ලබා ගත් ඉන්ධන ප්‍රමාණය | පසු ගිය මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | ධාවනය කළ කි.මී. පැ.මී. |
|---|---|---|---|---|
| | | | **42 L** | |
| 2023.01.02 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර උහන විරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදයගිරිය වැරැන්කැටගොඩ පොළ ආපසු අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 49 |
| 2023.01.03 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න නුගේලන්ද පොළ පියංගල ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2023.01.04 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර සිවිල් ආරක්ෂක බලකාය උහන විරගොඩ පාර ළමා නිවාසය ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදයගිරිය වැරැන්කැටගොඩ ගොනාගොල්ල උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | 212 | | 70 |
| 2023.01.05 | ප්‍රා.ස. සිට උහන විරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය වැරැන්කැටගොඩ ගොනාගොල්ල පොළ සෙනරත්පුර රෝහල ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |
| 2023.01.06 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර එයාපෝර්ට් හන්දිය ආපසු උහන විරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උහන පොළ අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |
| 2023.01.09 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර උහන නගරය විරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උදාගිරිගම වැරැන්කැටගොඩ පොළ ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 49 |
| 2023.01.10 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න නුගේලන්ද පොළ පියංගල ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2023.01.11 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර සිවිල් ආරක්ෂක බලකාය උහන විරගොඩ පාර ළමා නිවාසය ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදයගිරිය වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2023.01.12 | ප්‍රා.ස. සිට උහන විරගොඩ පාර උහන නගරය වැරැන්කැටගොඩ ගොනාගොල්ල පොළ සෙනරත්පුර රෝහල ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |

| | | | | |
|---|---|---|---|---|
| 2023.01.13 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර එයාපෝර්ට් හන්දිය ආපසු උහන විරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උහන පොළ අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |
| 2023.01.16 | ප්‍රා.ස. සිට උහන විරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදයගිරිය වැරැන්කැටගොඩ පොළ ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 49 |
| 2023.01.17 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න නුගේලන්ද පොළ පියංගල උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2023.01.18 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර සිවිල් ආරක්ෂක බලකාය උහන විරගොඩ පාර ළමා නිවාසය ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදයගිරිය වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2023.01.19 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල පොළ සෙනරත්පුර රෝහල උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 63 |
| 2023.01.20 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර එයාපෝර්ට් හන්දිය ආපසු උහන විරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උහන පොළ අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |
| 2023.01.23 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර උහන විරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදාගිරිගම වැරැන්කැටගොඩ පොළ අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | 214 | | 49 |
| 2023.01.24 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න නුගේලන්ද පොළ පියංගල ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2023.01.25 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර සිවිල් ආරක්ෂක බලකාය උහන විරගොඩ පාර ළමා නිවාසය ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදයගිරිය වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2023.01.26 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල පොළ සෙනරත්පුර රෝහල උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |
| 2023.01.27 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර එයාපෝර්ට් හන්දිය ආපසු උහන විරගොඩ පාර අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |

| | | | | |
|---|---|---|---|---|
| 2023.01.30 | ප්‍රා.ස. සිට පාළුම් කඳවුර උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදාගිරිගම වැරැන්කැටගොඩ පොළ ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 49 |
| 2023.01.31 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න නුගේලන්ද පොළ පියංගල ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| | මේ මස ලබා ගත් ඉන්ධන | **426 L** | | |
| | මුළු ඉන්ධන ප්‍රමාණය | | **468 L** | |
| | වැය වූ ඉන්ධන ප්‍රමාණය හා ධාවනයේ යෙදී ඇති කි.මී. ගණන (ඉන්ධන ලීටර් 01 කින් කි.මී. 3.5 ක් ධාවනය කළ හැකිය. මෙම මස කි.මී. 1274 ක් ධාවනයේ යෙදී ඇත) | | **364** | **1274 Km** |
| | මෙම මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | | **104 L** | |

Pilum

ලේකම්,

ප්‍රාදේශීය සභාව,

උහන.

එම්.ඒ.පී. මැදගොඩ

ලේකම්

ප්‍රාදේශීය සභාව

උහන

10. **වෙනත්.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ නොපැමිණීම සම්බන්ධ ලිපි සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම .

| | |
|---|---|
| 1. එන්.ජී. චතුරංග දර්ශන කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 2. පී.කේ. තරිඳු තුෂාන් ධනංජය මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 3. කේ.වී.ජී. නයනා කුමුදුනි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 4. ඩබ්. රාණි මැණිකේ මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |

**මූලාසනය.**

න්‍යාය පත්‍රානුකූලව අදට නියමිත වැඩ කටයුතු අවසන් බවත් මීළඟ සභාවාරය 2023.03.**02** වන දින පෙ.ව. 9.30 මෙම ස්ථානයේදී පැවැත්වෙන බවත් දක්වන ලදි. එදින ප.ව. 2.35 ට පමණ සභා කටයුතු අවසන් කරන ලදි.

ලේකම්
ප්‍රාදේශීය සභාව
උහන.

2023/**03**/**02** දින රැස්වීමේදී සංශෝධන සහිතව/රහිතව සභා සම්මත කරන ලදි.

ගරු සභාපති.